# Report of the Community Conservation Resilience Initiative in Sri Lanka



Community Conservation Resilience Initiative

Global Forest Coalition

**Country report on Sri Lanka**
**Community Conservation Resilience Initiative (CCRI)**
**June 2018**

**Author:** Leel Randeni
**Assessment facilitation:** Nirmanee Development Foundation

**For more information:** http://globalforestcoalition.org/resources/supporting-community-conservation/

**Cover photo:** Kitul tapping. Nirmanee Development Foundation/GFC

The production of this country report has been made possible thanks to the support of the Christensen Fund and the German International Climate Initiative (IKI). The German Federal Ministry for the Environment, Nature Conservation, and Nuclear Safety (BMU) supports this initiative on the basis of a decision adopted by the German Bundestag. The participatory community assessments reflected in this report have been made possible thanks to the community members themselves, and the Nirmanee Development Foundation.

**Disclaimer:**
The information contained in the case studies in this report has been provided by the national group responsible. As such, the report does not necessarily reflect the opinion or position of GFC, its donors or other contributors.

© Global Forest Coalition, June 2018

Community Conservation Resilience Initiative

Global Forest Coalition

# දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භයන් පිළිබඳ ව්‍යාපෘතිය



ශ්‍රී ලංකා වාර්තාව

## පටුන

පිටු අංකය

විධායක සාරාංශය

**1.** හැඳින්වීම **5**

**1.1** පසුබිම **5**

**1.2** පොදුවේ ශ්‍රී ලාංකික දේශීය ප්‍රජාව මුහුණ දුන් ගැටළු හා විඳවීම් **5**

**1.3** ප්‍රජාවන් ත්‍රිත්වය තෝරා ගැනීමට පාදක වූ කරුණු **5**

**1.4** එක් එක් ප්‍රජාවන් පිළිබඳ විස්තර **5**

**1.5** ව්‍යාපෘති කාල සීමාව පුරා නිර්මාණී සංවර්ධන පදනම වෙත පැවරුණු කාර්යය **6**

**2.** ඇගයීම් ක්‍රමවේදය **7**

**2.1** ඇගයීමට පාදක කරගත යුතු මූලධර්ම **7**

**2.2** ඇගයීම සඳහා ප්‍රවේශය **8**

**2.3** දරාගැනීම් හා ප්‍රජා සංරක්ෂණ මූලාරම්භකයන්ගේ අරමුණු **9**

**2.4** දරාගැනීම් හා ප්‍රජා සංරක්ෂණ මූලාරම්භකයන්ට අදාළ ක්‍රමවේදයේ ප්‍රධාන අංගයන් 09 කි **9**

**2.5** ඇගැයීම් ක්‍රමවේදය **11**

**3.** ප්‍රතිඵල හා සාකච්ඡාව **12**

**3.1** දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භයන් හා සම්බන්ධ ක්‍රියාකාරකම් **12**

**3.2** සූර්යයාගේ ආශිර්වාදයන් උපකාරයන් සැමරීම සහ ප්‍රජාව සුවපත් කිරීම **13**

**3.3** සර්ප විෂ වෙදකම පිළිබඳ පාරම්පරික දැණුම **15**

**3.3.1** පාරම්පරික සර්ප විෂ වෛද්‍යවරුන් සමඟ සක්‍රීය කතිකාවතක් පවත්වන අවස්ථාවක් **15**

**3.3.2** එකිනෙකාට ගෞරව කිරීම, අන්‍යෝන්‍ය විශ්වාසය බෙදාහදා ගැනීම සහ දේශීයව නිශ්පාදනය කරන ලද වෙදමහතුන්ගේ උපකරණ. **16**

**3.3.3** වන ඖෂධ නිෂ්පාදනය හා කතිකාව **17**

**3.4** කිතුල් කර්මාන්තය පිළිබඳ පාරම්පරික දැණුම **18**

**3.4.1** කිතුල් මැදීමේ අරගලය කිතුල් පැණි මෙන් මිහිරි නැත. **19**

**3.5** පාරම්පරික වී වගාකරන ප්‍රජාවන්ගේ පාරම්පරික දැනුම **20**

**3.5.1** පාරම්පරික වී වගාකරන ප්‍රජාවන්ට ඇති බාහිර හා අභ්‍යන්තර තර්ජන "ගැටළු ගස" නිර්මාණය කිරීමේ ක්‍රමවේදය **20**

**3.5.2** සාම්ප්‍රදායික වී වගාකරන මානව නිර්මිත තෙත්බිම් භූමි දර්ශන ගමේ පිරිමින් අතින් පමණක් නොව ගැහැණුන් අතින්ද සැකසේ. **22**

**3.6** උපදේශන පරීක්ෂණයක්, නැවුම් නවෝත්පාදක ශිල්ප ක්‍රම යොදා ගනිමින් පරිසර මිතුරු ජීවන රටා පණ ගැන්වීම සඳහා අන්‍යෝන්‍ය බෙදාහදා ගැනීම් හඳුන්වා දීම. **23**

**3.7** දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භයන්ට ඇති අභ්‍යන්තර හා බාහිර තර්ජන **24**

**4.** නිගමන හා යෝජනා **28**

**5.** නිර්දේශිත ලේඛන **33**

## විධායක සාරාංශය

ශ්‍රී ලංකාව ගෝලීය ජෛව විවිධත්ව උණුසුම් කේන්ද්‍රයක් ලෙසින් හඳුනා ගත් එක් අති සංවේදී ජීව කලාපයකි. ජෛව විවිධත්වයෙන් ඉතා පොහොසත් වුවත් එය හායනය වීමට ඇති තර්ජන ඉහළ මට්ටමක පවතින බැවින් සුවිශේෂී ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකාවේ රජය මෙන්ම ජන ප්‍රජාවද වග වී ඇත.

මෙහිලා රජය, ජන ප්‍රජාව ,සිවිල් සංවිධාන ඇතුළු සියළු පාර්ශ්වකරුවන්ගේ ඒකාබද්ධ ප්‍රවේශයක අවශ්‍යතාවය අවධාරණය වී ඇත. වසර දහස් ගණනක මානව ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ ජන ප්‍රජාවන් සම්බන්ධයෙන් හා ඔවුන්ගේ බලපෑම යටතේ ඇති ජෛව විවිධත්වය සම්බන්ධයෙන් වඩාත් වැදගත් වන්නේ ඔවුන්ගේ පාරම්පරිකව පැවත එන තිරසාර ජීවනෝපායයන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනයයි.

කෙසේ වෙතත් ඒ සඳහා කැපවූ වැඩ සටහන් ලංකාවේ ඉතා විරල වේ. එම සන්දර්භය තුළ නිර්මාණී සංවර්ධන පදනම, ගෝලීය වනාන්තර සංසදය සමඟ ඒකාබද්ධ ව්‍යායාමයක් ලෙස ප්‍රජා පාදක ක්‍රමවේදයක් යොදා ගනිමින් 2016 -17 වසර තුළ මෙම ඇගැයීම සිදු කොට ඇත. දරා ගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භයන් (CCRI) පිළිබඳව ඇගයීමේ ව්‍යාපෘතිය ලෙසින් නම් කොට ඇති එමඟින් පහල මට්ටමේ සිට ඉහළට යන ආකාරයෙන් (Down to Top) අන්තර්ජන්‍ය තිරසාර ජීවනෝපායයන්ට උපකාරී වීමට අපේක්ෂා කෙරේ.

එහිදී දේශීය ජනතාව හා ප්‍රාදේශීය ප්‍රජාවන් ඔවුන්ගේ පාරම්පරික ජීවනෝපායයන් හා සම්බන්ධිත ජෛව විවිධත්වය සංරක්ෂණය හා ප්‍රතිස්ථාපනය කිරීමට ඇති තර්ජන හඳුනා ගැනීමටත් ඒවාට විසඳුම් කේන්ද්‍රීය ප්‍රවේශයන්, ක්‍රමෝපායයන් හා ප්‍රතිපත්ති මෙවලම් යොදාගනිමින් සවිබල ගැන්වීමට අපේක්ෂා විය. එහිදී නියමු කාර්යයක් ලෙස දිවයිනේ සුවිශේෂ ජෛව විවිධත්වයන් හා සබැඳි උපායමාර්ගික වැදගත්කමක් ඇති මධ්‍ය කඳුකරය ආශ්‍රිතව හමුවන උඩරට වන ගෙළයන්හි පාරම්පරික ජීවනෝපායයන්හි නියැලී සිටින ප්‍රජාවන් තුනක් තෝරා ගැණුනි. ඒවා නම් පාරම්පරික කිතුල් මැදීම, සාම්ප්‍රදායික වී ගොවිතැන හා පාරම්පරික සර්ප විෂ වෛද්‍ය වෘතියේ නියැලී සිටින ප්‍රජාවන්ය. සූර්යයා හා ස්වභාවය පූජනීයත්වයේ ලා සැලකූ මූලික ස්වදේශීය ජන ප්‍රජාවන්ගෙන් ඔවුන් පැවත එතැයි විශ්වාස කෙරේ.

ඇගයීම් ක්‍රියාකාරකම් වලදී ප්‍රජාව තුළින්ම මතුවී එන මූලාරම්භකයන් උපායමාර්ගික දැක්මක් ලෙසින් ගොණු කිරීමට සුදුසු සහභාගිත්ව මෙවලම් යොදා ගැණුනි. ඇගැයීම සම්බන්ධවීමේදී කිසිදු මිලක් ගෙවීමකින් තොරව, කල්තබා මනාව ඔවුන් දැනුවත් කොට සිදුකිරීමට පියවර ගැනුනි. එහිදී දේශීය ප්‍රජාවන් සිය ජීවනෝපායයන් සමාජ හා ආර්ථික වශයෙන් ආකර්ශනීය නොවීමට තුඩුදී ඇති අභ්‍යන්තර හා බාහිර තර්ජන ලෙස යටත් විජිත යුගයේ ජීවනෝපායයන්ට සිදුවූ කෙනෙහිලිකම් වල ශේෂයන්, පවතින නීතිමය හා රාජ්‍ය යාමන යාන්ත්‍රණයේ හිදැස්, විවෘත වෙළෙඳපොල ආර්ථික ප්‍රසාරණය හා ප්‍රමාණවත් වෙළෙඳපොල දිරි ගැන්වීම් නොමැති වීම ආදිය හඳුනා ගන්නට යෙදුනි.

විසඳුම් වෙත යොමුවූ ප්‍රවේශයන් ලෙස ඔවුන් යෝජනා කරන්නේ ඔවුන්ගේ ජීවනෝපායයන්හි වටිනාකම් අගය කිරීම සඳහා ස්ථිරසාර යාන්ත්‍රනයකි. ඒ සඳහා බාහිර හා අභ්‍යන්තර පාර්ශ්වයන් වෙතින් ඉටු විය යුතුයැයි ඔවුන් අපේක්ෂා කරන්නේ ජීවනෝපායයන් හා බද්ධ වූ වෙළෙඳපල නොවන දීම් ලැබීම් හුවමාරු ආර්ථිකය (Reciprocal Economy) පණ ගැන්වීම, අනුපූරක වශයෙන් වෙළෙඳපොල බාධා ඉවත් කිරීම දිරි ගැන්වීම් ක්‍රියාත්මක කිරීම, බාධා ඉවත් කොට නීතිමය පිටිවහලක් ලබා දීම ආදියයි.

මෙය කියවන ඔබගේ බුද්ධි කලම්භනය සඳහා අවසන කතිකාවෙහි දී හෙළිදරව් වූ එක් සුවිශේෂ කරුණක් සඳහන් කොට ඇත. ප්‍රජාවේ වැඩිහිටියන් ගෙන් ඇතැමෙක් පැවසූ අන්දමට ශ්‍රී ලංකාවේ දේශීය දැනුම සංරක්ෂණය කල යුත්තේ ගෝලීය කාලීන අවශ්‍යතාවක් හේතුවෙනි. ඔවුන් පවසන්නේ අතීතයේ ජය කෙහෙළි නැංවූ ඔවුන්ගේ මුතුන් මිත්තන් සතුව ඉතා දියුණු තාක්ෂණික දැනුමක් තිබී ඇත. ඒ ඔවුනට පොළොවේ සියළු භෞතික හා රසායනික ප්‍රතික්‍රියාවන්ට මූලිකව පවතින මූල ධාතූන් පිළිබඳව මනා වැටහීමක් තිබීම හේතුවෙනි. ඔවුන් භාවිතයට ගන්නේද එම තාක්ෂණික සංකල්පයන් පමණක් බවද එය ජෛව විවිධත්වය සංරක්ෂණයෙන් හා ප්‍රතිස්ථාපනයෙන් වෙන් වූවක් ද නොවන බැවින් ඉඩක් ලදහොත් වත්මන් ගැටළු විසඳීමෙහි ලා ඒ දැනුමේ උපයෝගීතාවයන් යොදා ගනිමින් තිරසාර විසඳුම් සපයා දිය හැකි බව සඳහන් කරන්නට යෙදුනි.

## 1. හැඳින්වීම

### 1.1 පසුබිම

මෙම ව්‍යාපෘතිය, කැගල්ල ප්‍රදේශය කේන්ද්‍ර කොට ගෙන ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන නිර්මාණී සංවර්ධන පදනම, ගෝලීය වනාන්තර සංසදය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතියකි.

ව්‍යාපෘතිය ක්‍රියාත්මකව පැවතියේ 2016 අගෝස්තු මස සිට 2017 අගෝස්තු මාසය දක්වායි. මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක දෙකක තෝරාගත් ප්‍රජාවන් තුනක් කේන්ද්‍ර කරගනිමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. තෝරාගත් ප්‍රජාවන්ගේ චාරිත්‍රානුගත, පාරම්පරික ජීවනෝපායයන් හා අත්‍යන්තයෙන් බැඳුනු ස්වභාවික සම්පත්, දේශීය දැනුම හා ක්‍රියාකාරකම් වල අද දවසේ තත්වය මෙන්ම එයද ඇතුළත්ව සමස්ථයක් ලෙස ප්‍රජාවේ දරාගැනීම් සඳහා වන සංරක්ෂණ මූලාරම්භයන් ව්‍යාපෘතිය සඳහා පාදක විය.

### 1.2 පොදුවේ ශ්‍රී ලාංකික දේශීය ප්‍රජාව මුහුණ දුන් ගැටළු හා විඳවීම්

ශ්‍රී ලංකාව විවෘත ආර්ථිකයේ ප්‍රතිලාභ මෙන්ම ගැටළුද, ගෝලීයකරණ හා සබැඳුනු නව යටත් විජිතකරණයේ බලපෑම්ද නොඅඩුව භුක්ති විඳිමින් සිටින යුගයක් පසු කරමින් යයි. ජෛව විවිධත්වයෙන් පොහොසත් මෙන්ම ඒ හා මනා සුසංයෝගයෙන් බැඳුනු පාරම්පරික ජීවනෝපායයන් බොහොමයක් ඉහත බලපෑම් නිසා අර්බුදයට ලක්ව ඇතැයි යනු පොදුවේ ජනතාව දරන අදහසයි.

ශ්‍රී ලංකාවේ මුල් පදිංචි කරුවන් යයි සැලකෙන සූර්යයා හා ස්වභාවය පූජනීය ලෙස සැලකූ ජන ප්‍රජාවන්ගෙන් පැවත එන ජනතාවට ඇතිවී තිබෙන බලපෑම් ඉතා දරුණු ලෙස හැඟෙන්නේ වර්තමානයේ ඔවුන්ගේ ජීවනෝපායයන් අවුල් වියවුල් වී ඇති බැවිනි.

### 1.3 ප්‍රජාවන් ත්‍රිත්වය තෝරා ගැනීමට පාදක වූ කරුණු

- සර්ප විෂ වෙදකම පිළිබඳ පාරම්පරික දැණුම දරන ප්‍රජාවන්
- කිතුල් කර්මාන්තය පිළිබඳ පාරම්පරික දැණුම දරන ප්‍රජාවන්
- දේශීය වී වගාව පිළිබඳ පාරම්පරික දැණුම දරන ප්‍රජාවන්

### 1.4 එක් එක් ප්‍රජාවන් පිළිබඳ විස්තර

1. සර්ප විෂ වෙදකම පිළිබඳ පාරම්පරික දැණුම දරන ප්‍රජාවන්

සබරගමුව පළාතේ කැගල්ල දිස්ත්‍රික්කයේ හෙට්ටිමුල්ල මාබෝපිටිය ප්‍රදේශය ආශ්‍රිතව දැනටමත් දේශීය සර්ප විෂ වෙදකමේ නියැලෙන පාරම්පරික වෙද මහතුන්ගේ ප්‍රජාව

2. කිතුල් කර්මාන්තය පිළිබඳ පාරම්පරික දැණුම දරන ප්‍රජාවන්

මහනුවර දිස්ත්‍රික්කයේ ඉහළගම ප්‍රදේශයේ දැනටමත් කිතුල් තෙලිදිය,පැණි-හකුරු නිෂ්පාදන කටයුතු වල නියැලෙන ප්‍රජාවන්

3. දේශීය වී වගාව පිළිබඳ පාරම්පරික දැණුම දරන ප්‍රජාවන්

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ නෙළුන්දෙණිය සහ අරණායක ප්‍රදේශවල විසිරී ජීවත් වන ගොවිජනතාව ඇතුළත් වන සාම්ප්‍රදායික වී වගාවේ නියුතු ප්‍රජාව.

## 1.5 ව්‍යාපෘති කාල සීමාව පුරා නිර්මාණී සංවර්ධන පදනම වෙත පැවරුණු කාර්යය

තෝරාගත් ප්‍රජාවන්ගේ දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භයන් වෙත ප්‍රවිශ්ට වීම සඳහා උපායමාර්ගික දැක්මක් නිර්මාණය කිරීම ඔවුනට පැවරුණු මුල්ම කර්තව්‍යය විය. ඒ සඳහා නිර්මාණී සංවර්ධන පදනමේ කාර්ය මණ්ඩලය විසින් පෙර සූදානම් වීමේ සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී. එහිදී ව්‍යාපෘතියේ අභිමතාර්ථයන් ආයතනය තුළ ඇති ධාරිතා හැකියාවන් යොදාගෙන ළඟා කර ගත හැකි ආකාරය විමසා බලන ලදී.

## 2. ඇගයීම් මාර්ගෝපදේශ හා ක්‍රමවේදය

මෙම ඇගයීම් මාර්ගෝපදේශ සහ ක්‍රමවේදය සඳහා උපයෝගී කොට ගෙන ඇත්තේ ගෝලීය වනාන්තර සංසදය වෙනුවෙන් ආසියානු කලාපය තුළ දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භකයන් සම්බන්ධීකරණයේ නියුතු ටීනා රායි මහත්මියගේ Introduction to the CCRI methodology for CCRI report writers නම් ඉදිරිපත් කිරීමෙනි.

පහල මට්ටමේ සිට ඉහළට යන ආකාරයෙන් හා අන්තර්ජන්‍ය තිරසාර ජීවනෝපායන්ට උපකාරී වීම, දරා ගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භයන් (CCRI) පිළිබඳව ඇගයීමේ ව්‍යපෘතිය මඟින් බලාපොරොත්තු වේ.

දේශීය ප්‍රජාවන් මඟින් පාලනය වන ප්‍රදේශයන් (ICCA) ද ඇතුලුව, දේශීය ජනතාව හා ප්‍රාදේශීය ප්‍රජාවන් මඟින් ක්‍රියාත්මක කරනු ලබන, ජෛව විවිධත්ව සංරක්ෂණය සහ ප්‍රතිස්ථාපනය සඳහා වන ජෛව සංස්කෘතික ප්‍රවේශයන් සඳහා ප්‍රමාණවත් හා ඵලදායී ආකාරයන්ගෙන් සහයෝගය සපයන අයිතිවාසිකම් පාදක කරගත් පාරිසරික හා සාමාජීය වශයෙන් තිරසාර සහ මූල්‍යමය වශයෙන් ශක්තිමත් ජෛව විවිධත්ව සංරක්ෂණ හා ප්‍රතිස්ථාපන ප්‍රතිපත්ති වලට දායක වීම මෙම ඇගයීම් කිරීමේ කටයුතු වල අරමුණ වේ.

දරා ගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මුලාරම්භයන් පිළිබඳ ඇගයීම් කටයුතු වල ඉලක්කය පහත පරිදි වේ. එනම් ප්‍රාදේශීය ප්‍රජාවන් ගේ ජෛව විවිධත්වය සංරක්ෂණය සහ ප්‍රතිස්ථාපනය සඳහා ඔවුන්ගේ ජෛව සංස්කෘතික ප්‍රවේශයන්ගේ හා මූලාරම්භයන්ගේ දරාගැනීම් වලට අදාලව සහභාගිත්ව ඇගයීමක් සිදු කිරීමයි.

එහිදී එම මූලාරම්භයන් ශක්තිමත් කිරීමට හා පවත්වාගෙන යාම සඳහා සැපයිය හැති නීතිමය, දේශපාලනික, සමාජ ආර්ථික, මූල්‍යමය, තාක්ෂණික හා ධාරිතා වර්ධන උපකාරයන් පිළිබඳවද ඇගයීමක් සිදු කිරීමටද අපේක්ෂිතය.

### 2.1 ඇගයීමට පාදක කරගත යුතු මූලධර්ම

ප්‍රජාව වෙතින් ලබා ගන්නා අත්දැකීම්වල විවිධත්වයන් මනා ලෙස පිළිබිඹු විය යුතුය. ප්‍රාදේශීයව කරනු ලබන ඇගයීම් වෙනත් ප්‍රජාවන්ගේ විවිධත්වයන් හා විචිත්‍රත්වයන් සමඟ සමානකරණයකට හෝ පොදු බවකට ලක් නොකල යුතුය.

මෙම ඇගයීම් පදනම් වන්නේ අන්තර් සංස්කෘතික ක්‍රියාකාරකමක් ලෙසිනි. එහිදී අන්‍යොන්‍ය විශ්වාසය හා අවබෝධය බෙහෙවින් වැදගත් වේ. එමෙන්ම වඩාත්ම වැදගත් වන්නේ දේශීය සමාජයන් අතර හා තුල ඇති බල සබඳතාවයන්ය. එහිදී ප්‍රධාන සංස්කෘතිය සමානතාවයෙන් සැලකිය නොහැක.

සිය අවසන් අපේක්ෂාවන් ඉටුකර ගැනිමේදී ක්‍රියාවලිය මෙහෙය වන බලවේගය ප්‍රජාවයි. වාර්තාවේ ප්‍රජාවේ අභිමතය, ප්‍රවේශය හා දැක්ම පිළිබිඹු විය යුතුය. වාර්තා මඟින් දේශීය හා පාරම්පරික දැණුම් හා ප්‍රධාන ප්‍රවාහයේ දැණුම් පද්ධතීන් අතර ඥානවිභාගාත්මක පාලමක් හෝ සම්බන්ධයක් ගොඩනගා තිබිය යුතුය. දැණුම බෙදාහදා ගැනීමේදීත් හොඳින් දැනුවත් කොට කල්තියා නොමිලේ ලබා ගන්නා කැමත්ත (Free Prior and Informed Consent) පවත්වා ගැනීම කල යුතුය.

ප්‍රජාවේ සිටින දේශිය ජනතාවගේ මෙන්ම වෙනත් අයිතිවාසිකම් දරන කණ්ඩායම් වලටද අදාල වන අයිතීන් පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් ඇතුලත් විය යුතුය.

ක්‍රමවේදයන් සහභාගිත්ව මෙන්ම අපේක්ෂා මුදුන්පත් කිරීම සඳහා විය යුතුය. ප්‍රජාවන් තොරතුරු නිර්මාණය කරන්නන් විය යුතුය. සියළු ප්‍රජාවන්ගේ සාමාජිකයන් සමස්ථ ක්‍රියාවලිය තුලට සහභාගී විය යුතු අතර එම ස්ථානයන්හි භෞතිකව සිටිය යුතුය.

ඇගයීම් ක්‍රියාවලියේ සෑම පියවරකදීම කාන්තාවන් සමාන මට්ටමකින් ක්‍රියාකාරීව සහභාගී වීමට උනන්දු කල යුතු අතර ඒ සඳහා ඉඩ හා පහසුකම් සලසා දිය යුතුය. එමෙන්ම, ඇගයීම් ක්‍රියාවලියේ සෑම පියවරකදීම ස්ත්‍රී පුරුෂ සමානතාවයන් පිළිබඳ මානයන් ප්‍රජාවේ කාන්තාවන්ට ඇති විශේෂ අයිතිවාසිකම්, කාර්යභාරයන්, අවශ්‍යතා හා අපේක්ෂාවන් ආදිය හොඳින් සැලකිල්ලට ගත යුතුය.

හැකි සෑමවිටම කුඩා ළමුන් හා තරුණ තරුණියන් ක්‍රියාවලිය තුලට ක්‍රියාකාරීව සම්බන්ධකර ගැනීමට උත්සාහ කල යුතුය.

නායකත්ව තත්වයන් වලදී කාන්තාවන්ටද කොටසක් ස්ථාපිත කරන්න. කාන්තාවන්ට සිදුවිය හැකි තර්ජන හා අභියෝග තත්වයන් ඔවුන් අතරම සාකච්ඡා කිරිම සඳහා වෙනම ස්ථානයක් ඇති කිරීම සුදුසු වනු ඇත.

වාර්තාව තුල ආමන්ත්‍රනය කල යුතු ප්‍රශ්ණ හා ගැටළු දේශීය කරගැනීම සැලසුම් කිරීමේදී වැදගත්වන කරුණකි.

### 2.2 ඇගයීම සඳහා ප්‍රවේශය

ජෛව සංස්කෘතික සංරක්ෂණය, දේශීය දරා ගැනීම, හා ප්‍රතිස්ථාපන මූලධර්මයන් තේරුම් ගන්නේ කෙසේද? ජෛව සංස්කෘතික පද්ධතියේ කුමන කොටස් විශ්ලේශණය කරනු ලැබුවේද නිර්වචනය කරන්න. ප්‍රාදේශීය ඇගයීම් කේන්ද්‍රගත කරන ලද්දේ කුමක් සඳහාද යන්න දැක්විය යුතුය.

- ප්‍රාදේශීය ඇගයීම් මඟින් ඔබට සුවිශේෂ වශයෙන් ළගාකර ගැනීමට අවශ්‍ය වුයේ කුමක්ද?
- ප්‍රාදේශීය ඇගයීමේ සුවිශේෂිත ප්‍රතිපල මොනවාද?
- ඇගයීම සඳහා ලැබී තිබුණු කාලය හා අරමුදල් සීමාව තුල ඔබට ළගාකර ගත යුතුව තිබුනේ මොනවාද?

- දරා ගැනීම සඳහා වන ප්‍රජා සංරක්ෂණ ක්‍රියාමාර්ගයන් පිළිබඳ ඇගයීම ආරම්භවිය යුත්තේ උපායමාර්ගික දැක්ම පිලිබඳ ක්‍රියාවලියෙනි.
- ප්‍රජාවට මෙම ඇගයීම මගින් ළඟාකර ගැනීමට අවශ්‍ය වන්නේ මොනවාද?

**2.3 දරාගැනීම් හා ප්‍රජා සංරක්ෂණ මූලාරම්භකයන්ගේ අරමුණු**

01. මෙම ඇගයීම අවම වශයෙන් රටවල් 22 ක අවම වශයෙන් ප්‍රජාවන් 60 ක් වත් සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කිරීම.
02. ජෛව විවිධත්ව ප්‍රතිස්ථාපනය හා සංරක්ෂණය සඳහා ඇති ජෛව සංස්කෘතික ප්‍රවේශයන් තුල කාන්තාවන්ට විශේෂ වූ අයිතිවාසිකම්, කාර්ය භාරය සහ ඔවුන්ගේ අවශ්‍යතා පිලිබඳ සහභාගීත්ව විශ්ලේෂණයක් ඇතුළත් කිරීම.
03. දේශීය ජනතාවගේ අයිතිවාසිකම් වලට අදාළ වන්නා වූ මෙවලම් ද ඇතුලුව, අදාළ මානව හිමිකම් මෙවලම් වල සම්බන්ධතාවය විශ්ලේෂණය තුලට ඇතුලත් කිරීම.

**2.4 දරාගැනීම් හා ප්‍රජා සංරක්ෂණ මූලාරම්භකයන්ට අදාළ ක්‍රමවේදයේ ප්‍රධාන අංගයන් 09 කි**

01. සූදානම් වීම හා උපායමාර්ගික දැක්ම අදාළ රට සඳහා ඉළක්ක හා අරමුණ සඳහා පොදුවේ බෙදාහදාගත හැකි දැක්මක් ඇති කර ගැනීම, අවදානම් හා අභියෝගයන් සාකච්ඡා කිරීම, වර්තමාන තත්වය ශක්‍යතාවයන් සහ විවිධ භූමිකා හා කාර්ය භාරයන් හඳුනා ගැනීම.
02. සම්බන්ධීකරණය සහ පහසුකම් සැපයීම.
03. සම්බන්ධ කර ගන්නා ප්‍රජාවන් තෝරා ගැනීම.

    අවම වශයෙන් ප්‍රදේශ 03 ක් වත් තිබිය යුතුය. විවිධ පරිසර පද්ධතීන් නම් වඩාත් උචිත වේ. ප්‍රජාවන්ට ඇති විවිධ තර්ජන ආදර්ශනය කොට පෙන්වීම (Demonstrate)
04. ප්‍රජාවන් සමඟ එකිනෙකාගෙන් ඉගෙනීම හා කුසලතා බෙදාහදා ගැනීම.

    මෙය ඉදිරියට ගෙන යා යුත්තේ, එකිනෙකාට ඇති කාර්යයන් හා අත්දැකීම් ආදියට වන්දි ගෙවීම් හා අන්‍යොන්‍ය විශ්වාසය පදනම් කර ගනිමිනි. එමෙන්ම එයට ඇතුලත් විය යුතු ඒවාට නිදසුන් ලෙස නීතිමය උපකාර, සහභාගීත්ව ක්‍රමවේදය, සිතියම් ගත කිරීම හා අනෙකුත් මෙවලම් දැක්විය හැකිය.
05. පාදස්ථ තොරතුරු/පදනම් රේඛාව

    ප්‍රජාවගේ සංරක්ෂන කටයුතු හා වෙනත් එවැනි ගැටළු හා අර්බුධ වලට අදාලව, ප්‍රජාව ඇගයීම සඳහා හඳුනාගන්නා ඔවුන්ගේ වාසභූමි පිළිබඳ නීතිමය හා නීතිමය නොවන තත්වයන් පිළිබඳව තොරතුරු ඇතුලත් කිරිමට මේ මගින් හැකිවේ.
06. ඇගයීම් සැලසුම්/නිර්මාණය හා ක්‍රියාත්මක කිරීම.

    මෙම කටයුත්ත, සහභාගීත්ව හා සැවොම ඇතුලත් කර ගන්නා ආකාරයට විය යුතු අතර, දේශීය ක්‍රමවේදයන්ට අනුව ප්‍රශ්න විචාරීමට සැලකිලිමත් විය යුතුය. එමෙන්ම ප්‍රජාව මගින්

නිර්ණය කරන ලද දර්ශක යොදා ගැනීමත්, සංසන්දනාත්මක විශ්ලේශණයක් යොදාගනිමින් ගොණු කිරීමත් සිදු කල යුතු වේ.

07. උපාය මාර්ගික සැලසුම් කරණය හා ඉදිරි දැක්මක් ඇතිකර ගැනීම (ගොණුකිරිම)
විවිධ ක්‍රියාවලීන් සඳහා එක්රැස් කරගත් සියළු තොරතුරු පැහැදිලි නිර්දේශයන් කිරීම සඳහා ගොණු/ඒක රාශී කිරීම සඳහා ක්‍රමයක් යොදාගත යුතුය. අභ්‍යන්තර සහිකයින් සඳහා එනම් ප්‍රජාවේ ජනතාව හා ප්‍රාදේශීය භාෂාවලින් හා බාහිර/පිටස්තර සහිකයින් සඳහා , එනම් ජාතික රාජ්‍යයන්, අරමුදල් සම්පාදකයන්, ප්‍රතිපත්ති සම්පාදකයින් හා සංවිධාන සඳහා විවිධ ඒත්තු ගැන්වීම් හා උපදේශනාත්මක ක්‍රියාමාර්ග සඳහා කරුණු ගොනු කිරිමේ ක්‍රමයක් සකස් කල යුතුය.

08. උපාය මාර්ගික උපදේශනය සහ ප්‍රජාවන්ට බලපාන උපායමාර්ගික තීරණ ගැනීම,
ඇගයුම්, පසු විපරම් හා ප්‍රජා සැලසුම් ක්‍රියාත්මක කිරීම.

09. එළි දැක්වීම (Reflection), වාර්තාකරණය හා පුනරීක්ෂණය/ වෙනස්කම් සිදු කිරීම.

මෙය දිගින් දිගටම සිදු කරමින් යන කටයුත්තක් නිසා CCRI හා ජෛව විවිධත්ව සංරක්ෂණය අතර ජෛව සංස්කෘතික සම්බන්ධය සුරක්ෂිත කිරීම සඳහා එය බාහිරයට පිළිබිඹු කොට පෙන්වීමට අදාල මූලධර්ම හා අංගයන් නැවත විමසා බැලීම අවශ්‍ය වේ.

| ක්‍රියාකාරකම | සිදුකරන ලද ආකාරය හා ප්‍රගතිය |
|---|---|
| 1. ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම | කිසිදු ගෙවීමකින් තොරව, කල්තබා දැනුවත් කොට ප්‍රජාවේ විශ්වාසය ඇතිකොට ඔවුන්ගේ කැමැත්ත ලබාගෙන (FPIC) සක්‍රිය සහයෝගය ලබා ගැනීමට කටයුතු කොට ඇත. |
| 2. රාජ්‍ය ආයතන දැනුවත් කිරීම හා සහයෝගය ලබා ගැනීම | අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා එක්සත් ජාතීන්ගේ ජෛව විවිධත්ව සම්මුතියේ ජාතික නියෝජිතායතනය වන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කොට ඇත. |
| 3. ප්‍රජාවන් සමඟ කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම | පාරම්පරික සර්ප විෂ වෙද ප්‍රජාව සමඟ රැස්වීම් 12 ක්ද, කිතුල් ප්‍රජාවන් සමඟ රැස්වීම සාකච්ඡා වට 8 ක්ද, දේශීය වී ගොවීන් සමඟ සාකච්ඡා වට 6 ක්ද පවත්වා පාදස්ථ තොරතුරු ලබා ගෙන ඇත. |
| 4. ප්‍රජා තුල ඇති කුඩා කණ්ඩායම් හා තනි පුද්ගලයින් සමඟ සාකච්ඡා පැවැත්වීම | පාදස්ථ තොරතුරු ස්ථිර කර ගැනීම සඳහා සියළු ප්‍රජාවන් ගෙන් සාමාජිකයින් 30 දෙනා බැගින් තෝරාගෙන එම කටයුතු සිදුකර ඇත. |
| 5. ප්‍රජාවේ සාමාජිකයින් කැඳවා කතිකාවක් ඇතිකිරීම සඳහා වැඩමුළු සංවිධානය කිරීම | ජාතික වැඩමුළුව 2017 මාර්තු මස 14-15 දෙදින තුළ කෑගල්ලේදී පවත්වන්නට යෙදුනි. |

| | |
|---|---|
| 6. ප්‍රජා ජෛව සංස්කෘතික ප්‍රඥප්තීන් සැකසීම | ප්‍රජා 03 සඳහාම ප්‍රජා ජෛව සංස්කෘතික ප්‍රඥප්තීන් සැකසීම සඳහා තොරතුරු සපයා ගැනීම සම්පූර්ණ කොට ඇත. ඒවා ලිවීමේ කටයුතු අරඹා ඇත. |
| 7. විෂය නිර්දේශ සකස් කිරීම හා සංවර්ධනය | පාරම්පරික සර්ප විෂ වෙද මහතුන් සතු දැනුම සඳහා විෂය නිර්දේශ සකස් කිරීම අරඹා ඇත. |
| 8. ජෛව සංස්කෘතික නිෂ්පාදන සැකසීම සඳහා උපකාර වීම | සර්ප විෂ ගල නිපදවීම හා වරාල වර්තිය බෙහෙත් කුඩු සැකසීම සඳහා සර්ප විෂ වෛද්‍ය ප්‍රජාවට සහය වී ඇත. |
| 9. සීසීආර්අයි ජාලය හා උපදේශකයින් සමඟ නව තොරතුරු හුවමාරු කරගැනීම හා යාවත්කාලීන කිරීම | ප්‍රගතිය යාවත්කාලීන කිරීම හා ජාතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රතිදානයන් අනුප්‍රවාහගත කිරීමට කටයුතු කිරීම. |
| 10. සය මාසයක ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි වාර්තාවක් ඉදිරිපත් කිරීම | ඉදිරිපත් කොට ඇත. |
| 11. ජාතික මට්ටමින් සීසීආර්අයි කටයුතු පිළිබඳ ඇගයීමක් සිදු කිරීම | ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික සැලැස්මට ඇතුල් කිරීම. |
| 12. අවසාන වාර්තාව සකස් කිරීම | සකස් කොට ඇත. |
| 13. අවසාන වාර්තාව ඉදිරිපත් කිරීම | ඉදිරිපත් කොට ඇත. |

## 2.5 ඇගැයීම් ක්‍රමවේදය

ප්‍රජා හඳුනා ගැනීමෙන් පසු ඔවුන්ගේ ක්‍රියාකාරී සහයෝගය ලබා ගැනීම සඳහා කිසිදු ගෙවීමකින් තොරව, කල්තබා දැනුවත් කොට ප්‍රජාවේ විශ්වාසය ඇතිකොට ඔවුන්ගේ කැමැත්ත ලබාගෙන (Free Prior Informed Consent ) සක්‍රිය සහයෝගය ලබා ගැනීමට කටයුතු කොට ඇත. එහිදී ව්‍යාපෘතියේ අරමුණු ප්‍රජාව වෙත අවබෝධ කිරීමට බුද්ධි කලම්බන අභ්‍යාසයක් සහභාගිත්ව ප්‍රවේශය යොදා ගනිමින් සිදුකරන ලදී.

ඇගයීම් වලදී තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රජාවේ උපාය මාර්ගික දැක්ම උද්දීපනය කිරීම සඳහා විවිධ සහභාගිත්ව ඇගයුම් ශිල්ප ක්‍රම යොදා ගෙන ඇත. කාල රේඛාව මඟින් ප්‍රජාවන් වර්තමානයේ සිටි තත්වයට පත්වීමට හේතු වූ කාරණා පෙල ගැස්වීම, අනාගත අපේක්ෂා සිතියම මඟින් ප්‍රජා සාමාජිකයින්ගේ පරිකල්පනය පුබුදුවා සම්පත් රාශිකරණයේදී ඔවුන්ගේ කාර්ය භාරය දැන ගැනීමට ද පහසුකම් සලසන ලදී. ඒ හැරුනු විට ප්‍රජාවේ සම්පත් පැතිකඩ ඇගයීම සඳහා හරස්කඩ චාරිකා සිදුකරන ලදී.

ගැටළු ගස හා අරමුණු ගස සාමූහිකව ගොඩනැගීම ප්‍රජාව මුහුණ පා ඇති ගැටළු ඔවුන්ටම අවබෝධ කරගැනීම හා ප්‍රමුඛතාගත කිරීමටත් පහසුකම් සලසන ලදී. මෙම සියළු කටයුතු වලට නිර්මාණී සංවර්ධන පදනමේ කාර්ය මණ්ඩලය ක්‍රියාකාරීව සහභාගි විය.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 දරාගැනීම් සඳහා වන සංරක්ෂණ මූලාරම්භයන් හා සම්බන්ධ ක්‍රියාකාරකම්

**ව්‍යාපෘතියේ ප්‍රජාවන්ගේ ධාරිතා වර්ධන ජාතික වැඩ මුළුව 2016 මාර්තු මස 14 හා 15 දෙදින තුළ කැගල්ල පරගම්මන සණස කැම්පස් අධ්‍යාපන මණ්ඩපයේදී පැවැත්විනි.**





**ඡායාරූප අනුග්‍රහය: මහේෂ් රූපසිංහ** **ඡායාරූප අනුග්‍රහය: නිමල් හේවානිල**

**වම් පස ඡායාරූපය:** නිර්මාණී සංවර්ධන පදනමේ විධායක අධ්‍යක්ෂ නිමල් හේවානිල මහතා කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ ස්වදේශික ජනයාගේ අයිතිවාසිකම් පිළිබඳව හඬ නගන දේශීය දැණුම පිළිබඳව විද්වතෙක් මෙන්ම ක්‍රියාකාරිකයෙක්ද වන මතුගම සෙනවිරුවන් මහතා හඳුන්වා දෙනු ලබයි. සෙනවිරුවන් මහතා පාර්ශවකරුවන්ගේ වැඩමුළුවේදී දේශීය දැණුම සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳව සාරගර්භ දේශනයක් පවත්වන ලදී.

**දකුණුපස ඡායාරූපය:** මහේෂ් රූපසිංහ හා නිශාන්ත යන මහතුන් නිර්මාණී සංවර්ධන පදනමේ ක්‍රියාකාරී සාමාජිකයෝ වෙති. පාර්ශවකරුවන්ගේ වැඩමුළුව අතරතුර ඔවුන් දෙදෙනා විසින් ජෛව සංස්කෘතික ප්‍රඥප්තීන් නිර්මාණය කිරීම සඳහා තොරතුරු එක්රැස් කිරීමේදී ලද අත්දැකීම් බෙදා හදා ගන්නා ලදී. මෙහිදී සීසීආර්අයි වැඩසටහන පිළිබඳව ගෝලීය වනාන්තර සංසදයේ විධායක අධ්‍යක්ෂිකා සිමෝන් ලිවේරා මහත්මිය දේශනයක් පවත්වන ලදී. ස්ත්‍රී පුරුෂ සමාජ භාවයන්ට අදාළව පාරම්පරික ජීවනෝපායයන් සම්බන්ධයෙන් තත්වය ඇගැයීම් කටයුතු වලදී වැදගත් වන ආකාරය පිලිබඳව ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී. ජෛව විවිධත්වය සංරක්ෂණය හා ප්‍රතිස්ථාපනය සම්බන්ධයෙන් කාන්තාව අතින් වැදගත් කාර්ය භාරයක් ඉටු වන බැවින් මෙම ඇගැයීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් බව ටීනා රායි මහත්මිය සඳහන් කලාය. පාරිසරික යුක්ති ආයතනයේ විධායක අධ්‍යක්ෂ හේමන්ත විතානගේ මහතා දේශගුණ විපර්යාස වලට ඔරොත්තු දීම හා අනුහුරු වීම අළලා එහි වැදගත්කම පිළිබඳ සාරගර්භ දේශනයක් පැවැත්වීය. ජනතා සහන නීති පදනමේ මිහිරි ගුණරත්න මහත්මියද (කරු. ඇමිණුම බලන්න) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලීල් රන්දෙනි මහතාද දේශන පවත්වන ලදී.

**3.2 සූර්යයාගේ ආශිර්වාදයන් උත්සවාකාරයෙන් සැමරීම සහ ප්‍රජාව සුවපත් කිරීම**





**ඡායාරූප අනුග්‍රහය: ලහිරු වනිගසේකර** **ඡායාරූප අනුග්‍රහය: ජටිල මාගස්සූරිය**

**වම්පස ඡායාරූපය:** ශාන්තිකර්ම නමින් හඳුන්වන්නේ සාම්ප්‍රදායික සුවකිරීමේ උත්සවයන්ය. නිර්මාණී සංවර්ධන පදනම මඟින් ප්‍රජාවගේ ධාරිතා වර්ධන වැඩමුළුව අතරතුර ශාන්ති කර්මයක් සංවිධානය කරන ලදී. ස්වභාවය හෝ ප්‍රකෘතිය ලෙසින් හඳුන්වන පරිසර පද්ධතියේ ජෛව සංස්කෘතික පදනම මූලධාතු හතරකින් නිර්මාණය වී ඇතැයි යන්න සාම්ප්‍රදායික විශ්වාසයයි. එය ***පඨවි*** **(තද ගතිය),** ***ආපෝ*** **(දියරමය ගතිය),** ***තේජෝ*** **(දවන ගතිය),** ***වායෝ*** **(සැලෙන ගතිය)** ලෙසින් හඳුනා ගැනේ. මෙකී මූල ධාතුව අන්‍යෝන්‍ය සමානතාවයෙන් පැවතීම මිනිසාගේ මෙන්ම පරිසරයේද නිරෝගී භාවයට බෙහෙවින් වැදගත්බව පාරම්පරික විශ්වාසයයි. ශාන්තිකර්ම සිදුකරන්නේ මෙම මූලධාතූන් සතුටට පත්කොට මානසික හා කායික සෞඛ්‍යය සුරක්ෂිත කිරීමටයි.

**දකුණුපස ඡායාරූපය:** විධායක අධ්‍යක්ෂ නිමල් හේවානිල මහතා නව අවුරුදු උදාවත් සමඟ පැවති සූර්ය මංගල්‍යකදී කාන්තාවන් පිරිසක් සමඟ රබන් වයන අවස්ථාවක්. රබන් මඟින් සංකේතවත් කෙරෙන්නේ සූර්යයායි. සෑම වර්ෂයකම නව අවුරුදු උදාවත් සමඟ සූර්යයා සිය උච්චතම රාශිය වන මේෂ රාශියට පැමිණේ. සූර්යයා වන්දනාමාන කල පුරාණ හෙළයන් කල ආකාරයටම අදත් සූර්ය මංගල්‍ය උත්සව වලදී රබන් වයා සතුට පල කරති .

ජීවනෝපායයන් සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී සූර්ය හා චන්ද්‍ර මාස ක්‍රමයට සැකසූ පංචාංග ලිතෙහි සඳහන් සුබ වේලාවන් යොදාගැනීමත් අසුබ වේලාවන් මඟ හැරීමත් මඟින් කාර්ය සිද්ධිය වේයැයි ඔවුන් විශ්වාස කරති. ඔවුන්ගේ චාරිත්‍රානුගත ජීවන ප්‍රවෘත්තීන්ට හා ජීවිකාවන්ට අදාළ සාම්ප්‍රදායික දැනුම් සම්භාරයන් බොහොමයක් මුඛ පරම්පරාගතව කට වහර තුළ ආරක්ෂා වී ඇත.

ප්‍රජාවේ දරාගැනීම් සඳහා වන සංරක්ෂණ ක්‍රියාකාරකම් වල තත්වය , ප්‍රවනතාවයන් හා මුහුණ දීමට සිදුවී ඇති තර්ජන ආදිය ඇගයීමකට ලක්කරන ලද්දේ ඇගැයීම් කාල සීමාව තුල ක්ෂේත්‍ර චාරිකා, ජන හමු, රැස්වීම් හා ජනතාවගේ සමාජ ක්‍රියාකාරකම් වලට සහභාගි වීමෙනි. නිර්මාණී සංවර්ධන පදනම

ප්‍රදේශයේ දේශීය ජනතාව හා ප්‍රාදේශීය ප්‍රජාවන් සමඟ එක්ව ඇගැයුම් කටයුතු සඳහා මඟ පෙන්වනු ලැබීය.

අතීතයේ සිටම භූමිය හා ආශ්‍රිත සම්පත්, මිනිස් ශ්‍රමය, ගොවිපල් සතුන්ගෙන් ලබාගන්නා ශ්‍රමය ආදීය සම්බන්ධයෙන් චාරිත්‍රානුගත ක්‍රියාකාරකමක් ලෙසඅන්‍යෝන්‍ය හුවමාරුව ප්‍රමුඛව පැවතියද වර්තමානයේ එය සීග්‍ර සෝදාපාළුවකට ලක්වී ඇත. සියළු ප්‍රජාවන් ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායට අනුගත වුවත් ස්වභාවය හා සූර්යයා වන්දනාමාන කිරීමේ වතාවත් ආදිය ඇතැම් විට හමුවේ.  මුඛ පරම්පරාවෙන් පවතින දැනුමට අනුව, මුල් ගෝත්‍ර හතරකි. ඒවානම්, යක්ඛ, නාග, අසුර හෝ දේව සහ රාක්ෂ වේ. ඔවුන්ගේ සම්භවය පිළිබඳව පවතින එක් ජන ප්‍රවාදයක් නම් ගෝත්‍ර හතරම එක්වී,එකිනෙක හා මුසු වීමෙන් සිංහල ජාතිය නිර්මාණය වීමයි. එය සිදුවී ඇතැයි පැවසෙන්නේ දෘෂ්ඨිවාදී පරිවර්තනයකිනි. ගෝත්‍රිකයෝ බුදුන් වහන්සේගෙන් බණ අසා පැහැදී බුදු දහම වැළඳ ගැනීමෙන් මෙය සිදුවී ඇතැයි පැවසේ.



ඡායරූප අනුග්‍රහය : නිමල් හේවානිල

සියළුම ප්‍රජාවන් පොදුවේ බෙදාහදා ගන්නා පාරිසරික වශයෙන් ඉතා වැදගත් සමාජ-පරිසර විද්‍යාත්මක නිෂ්පාදන භූමිදර්ශනයක් වන උඩරට වන උයන් කෘෂි පරිසර පද්ධතිය හා හෙල්මළු කුඹුරු යාය

### 3.3 සර්ප විෂ වෙදකම පිළිබඳ පාරම්පරික දැනුම

තෝරාගත් ප්‍රජාවන් වූයේ සබරගමුව පළාතේ කැගල්ල දිස්ත්‍රික්කයේ පාරම්පරික සර්ප විෂ වෙද මහතුන් ගේ ප්‍රජාව හා පාරම්පරික වී වගා කරන ප්‍රජාවත් මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාරම්පරික කිතුල් කර්මාන්තයේ නියැලෙන ප්‍රජාවත්ය. ඔවුන් ජීවත් වන්නේ මාඔයේ හා මහවැලි ගංගාවේ ජලපෝෂක ප්‍රදේශයේයි. සියළු ප්‍රජාවන්ගේ ජීවනෝපායයන්ට පසුබිම සපයන්නේ අතීත රාජධානි යුගයේ සිට පැවත එන

ඔවුන් පැවත එන්නේ දැනට නෂ්ට වී ඇතැයි සැලකෙන, සූර්යයා හා ස්වභාව ධර්මය වන්දනාමාන කල ශ්‍රී ලංකාවේ මුල් ගෝත්‍රිකයන්ගෙන් යැයි සැලකේ. ප්‍රජාවන් ජීවත් වන්නේ ඔවුන්ගේ මුතුන් මිත්තන්ගෙන් උරුමවූ භූමි ප්‍රදේශ තුලයි. ඔවුන් වෙසෙන වාසභූමි සහ සමස්ථ පරිසර පද්ධතියම පාරම්පරික වී ප්‍රභේද, කිතුල් ශාක, හා ඖෂධ පැලෑටි විවිධත්වයන් මෙන්ම ඔවුන්ගේ පාරම්පරික ජීවනෝපායයන්ට අවශ්‍ය වන අමුද්‍රව්‍ය සංරක්ෂණය කිරීම අරභයා වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. ඔවුන්ගේ නිවාස විසිරී පැවතියද, ප්‍රජාව සියළු පොදු කටයුතු වලදී සමස්ථ භූමි ප්‍රදේශයම බෙදා හදාගෙන කටයුතු කරති. බොහෝදෙනෙකුට රජයේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් ලබා දෙන ලද ඔප්පු හිමිකම් ඇත. දේපල අයිතිය පිළිබඳ තත්වය එසේ වුවද, භූමි පරිභෝජන ක්‍රියාකාරකම් හැම විටම පුද්ගලික අභිමතය අනුවම සිදු නොවේ.

#### 3.3.1 පාරම්පරික සර්ප විෂ වෛද්‍යවරුන් සමඟ සක්‍රීය කතිකාවතක් පවත්වන අවස්ථාවක්



**ඡායාරූප අනුග්‍රහය: ලීල් රන්දෙනි**

මෙම ඡායාරූප පාරම්පරික සර්ප විෂ වෙදමහතුන් සමඟ පවත්වන ලද සාකච්ඡාවකදී ගන්නා ලද්දකි. නිර්මාණී සංවර්ධන පදනමේ විධායක අධ්‍යක්ෂ, නිමල් හේවානිල මහතා සහ වෛද්‍යවරුන්ගේ ප්‍රධානී ටිකිරිබණ්ඩා මහතා හා එහි ලේකම්තුමා මූලාසනයේ වෙති. මෙම අවස්ථාවේ සිදුවූ විශේෂ සිදුවීමක් නම් සබරගමු පලාතේ දේශීය වෙදකමේ සුලභව භාවිතා වන රෝග ගනනාවකටම ඖෂධයක් වන “වරාල වර්තිය” නම් වූ ඖෂධය වෛද්‍යවරුන්ට බෙදා දීමයි. ඒ සඳහා සියළු බරපැන දරන ලද්දේ නිර්මාණී සංවර්ධන පදනම මඟිනි. වරාල වර්තිය නිෂ්පාදනය කිරීම සඳහා දුර්ලභ ඖෂධ වර්ග 15 කට වඩා අවශ්‍ය වන අතර ඇතැම් ඖෂධ වෙළඳ පොලෙන් මිලදී ගැනිමට සිදුවේ. පාරම්පරික විෂ වෛද්‍යවරුන් පැමිණිලි කරන ආකාරයට ඖෂධ වල ඇති සුවකිරීමේ ගුණය උසස් ගුණාත්මයෙන්

යුතුව ලබාගැනීමට අවශ්‍ය වුවත් ඒවා වෙළඳපලෙන් සපයා ගැනීම අපහසු බවයි. ඔවුන් චෝදනා කරන්නේ බොහොමයක් ඉන්දියාවෙන් ආනයනය කරනු ලබන ඖෂධ ගුණාත්මයෙන් අඩු මෙන්ම නැවුම් තත්වයෙන් නොමැති බවයි. ඉහළ ගුණාත්මයෙන් යුතු ඖෂධ මෙරටෙහිම නිපදවීමේ වැදගත්කම රජය අවබෝධ කොට ගෙන ඔවුන්ට ඒවා වගා කිරීමට උපකාර හා දිරිගැන්වීම් ලබාදුන හොත්, ඔවුන්ට ඒවා නිෂ්පාදනය කල හැකි බව ඔවුන් විශ්වාසයෙන් සපථ කරති. මෙවැනි හමු සෑම මසකටම එකක් බැගින් පැවැත්වේ. නිර්මාණී සංවර්ධන පදනම ඒවාට අනුග්‍රහය දක්වයි. මෙවැනි හමුවලදී වෛද්‍යවරු සිය අත්දැකීම් බෙදාහදා ගනිමින් කතිකාව පෝෂණය කිරීමට බොහෝ කැමැත්තක් දක්වති.



**ඡායාරූප අනුග්‍රහය: නිමල් හේවානිල**

**ව්‍යාපෘතියේ සහභාගිත්ව ඇගයීම් කටයුතු සිදුවෙන අතරතුර සිදුකරන ලද හරස්කඩ චාරිකාවකදී පාරම්පරික සර්ප විෂ වෛද්‍ය ටිකිරි බණ්ඩා මහතා ඔහුගේ නිවසට පැමිණි නිරීක්ෂකයින් කණ්ඩායමක් සමඟ.**

**3.3.2 එකිනෙකාට ගෞරව කිරීම, අන්‍යෝන්‍ය විශ්වාසය බෙදාහදා ගැනීම සහ දේශීයව නිශ්පාදනය කරන ලද වෙදමහතුන්ගේ උපකරණ.**




**ඡායාරූප අනුග්‍රහය: නිමල් හේවානිල**

**වම්පස ඡායාරූපය:** දෙඅත්ල එකට ගෙන හිස නමා එකිනෙකාට ආචාර කිරීම ශ්‍රී ලංකාවේ ගෞරව සම්ප්‍රයුක්ත සැලකීමේ හා තුති පිදීමේ ප්‍රකට චාරිත්‍රයකි. ප්‍රජාවේ බොහෝ දෙනෙකු එකිනෙකා හමුවන අවස්ථාවලදී මෙවැනි ආචාර සමාචාර විධි සුලබව දක්නට ඇත. නායක සර්ප විෂ වෛද්‍යවරයා වන ටිකිරි බණ්ඩා මහතා තවත් ජ්‍යෙෂ්ඨ පාරම්පරික වෛද්‍යවරියකට සිය ආචාරය පුද කරන්නේ ඖෂධ ද්‍රව්‍ය බෙදාදීම සඳහා පැවති උත්සවයකදීය. මෙයින් පැහැදිලි වන්නේ පාරම්පරික ජීවනෝපායන්ට අදාල වටිනාකමක් හා හර පද්ධතීන් තුල ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා අනෝන්‍ය ගරු කිරීම හා විශ්වාසය පුරුදු වී ඇති බවයි. එහෙත් ශ්‍රී ලාංකීය ග්‍රාමීය සංස්කෘතියෙන් ප්‍රගමනය වූ නූතන කාර්මීකරනය හා සම්බන්ධ රැකියාවන් ආශ්‍රිතව මෙබඳු චාරිත්‍ර ඉතා දුර්ලභය.

**දකුණුපස ඡායාරූපය:** ඉහත දකුණු ඡායාරූපයේ සිටින කමලා අලංකාර මහත්මිය පාරම්පරික සර්ප විෂ වෛද්‍යවරියකි. ඇය අත තිබෙන්නේ කඩිනමින් ප්‍රතිකාර සඳහා යොදා ගත හැකි බෙහෙත් ගුලි ආදිය ගබඩා කිරීමට යොදා ගන්නා, තැනින් තැන ගෙන යාහැකි උපකරණයකි. එය එතුමියට සිය පියාගෙන් තෑගි ලැබුනු පාරම්පරිකව උරුම වූ උපකරණයකි. මී හරකෙකුගේ අඟකින් නිමවා ඇති එහි බොහෝ කාලයක් ඖෂධ වල ගුණය වෙනස් නොවී ගබඩා කල හැකි බව ඇය පවසන්නීය. මී හරක් අඟේ ඇති තද ගතිය, පෘථිවි ගුණය නිසා ඒ ලක්ෂණය එයට ලැබී ඇත.

නූතන බටහිර ඇලොපතික වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත විමට පෙර, පුරුද්දක් වශයෙන් ගෙන් ගෙට ගොස් රෝගීන්ට ප්‍රතිකාර කිරීමට දේශීය වෛද්‍යවරුන් පුරුදු වී සිටියහ. මෙවැනි මී හරක් අං වලින් නිර්මානය කරන ලද ඖෂධ මංජුසා එකල සුලබ උපකරණයක් ලෙස භාවිතා වී ඇත. එවැනි වෛද්‍යවරුන්ගේ සමාජ සේවය බොහෝ දෙනාගේ ඇගයීමට ලක්විය.

### 3.3.3 වන ඖෂධ නිෂ්පාදනය හා කතිකාව

පාරම්පරික සර්ප විෂ වෛද්‍යවරුන් ඔවුන්ගේ ප්‍රතිකාර කටයුතු සඳහා ඖෂධ පැලෑටි හා ශාකමය නිස්සාරකයන් විශාල සංඛ්‍යාවක් යොදා ගනිති. ඔවුන්ගේ ගෙවතු ඖෂධ පැලෑටි ගබඩාවන්ය. නැවුම්ව නෙලා ගන්නා ලද අළුත් ශාකමය ද්‍රව්‍ය බෙහෙත් සැකසීමේ වට්ටෝරු සඳහා යොදා ගැනීමට ඔවුන් වැඩි මනාපයක් දක්වති. සංරක්ෂණය සුරක්ෂිත කරනු වස් වතාවත් ආදිය ඉටුකොට ඖෂධ නෙලා ගැනීම ඔවුහු නිරතුරුවම සිදු කරති. වෛද්‍යවරුන් තහංචියක් මෙන්ම සුව කිරීමේ බලය පවත්වා ගැනීම සඳහා පේවී සිටීමේ අභිලාෂයෙන් සතුන් මැරීමෙන් වළකින අතර මස් මාංශ, බිත්තර ආදියද අනුභව නොකරති. ඔවුන් තමා කැමති අයුරින් ජීවත් වීමට සතුන්ට ඇති අයිතිය අගය කරති. උඩරට වන ගෙළුයන් ඉතා ඉහළ දරා ගැනීමේ හා ඔරොත්තු දීමේ හැකියාවක් සහිත පරිසර පද්ධතීන් ලෙස සැලකේ. ඇතැම් සර්පයින් ආහාර දාම වල ඉහළම මට්ටමේ හමුවන පළමු මාංශ භක්ෂකයින්ය. එබැවින් ඔවුන්ගේ සුලබතාවය පරිසර පද්ධතියේ පොහොසත් බව, විවිධත්වය හා නීරෝගීභාවය පිළිබඳ විශ්වසනීය දර්ශකයන් ලෙස සැලකේ.



ඡායාරූප අනුග්‍රහය: මහේෂ් රූපසිංහ



ඡායාරූප අනුග්‍රහය: නිමල් හේවානිල

**වම්පස ඡායාරූපය:** නිමල් හේවානිල මහතා පාරම්පරික සර්ප විෂ වෛද්‍යවරුන්ගේ සභාවක් අතරතුර කතිකාවක නියැලී සිටියි. විවෘත සාකච්ඡා මණ්ඩපයකට වෛද්‍යවරුන් කැඳවා ඖෂධ පැලෑටි හඳුනා ගැනීම හා භාවිතයන් සාකච්ඡා කිරීම ශ්‍රී ලංකාවේ දරාගැනීම සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භය තුල නිරතුරුවම සිදුවූ සමාජ සජීවීකරණ ක්‍රියාකාරකමකි. පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුමට අගය කිරීමක් ලබාදීමට එය මනා පිටුබලයක් සපයන වේදිකාවක් විය.

**දකුණු පස ඡායාරූපය:** ශාකමය ද්‍රව්‍යයන්ගෙන් උකහා ගන්නා ඖෂධීය තෙල්වර්ග හා යුෂ වර්ග පුළුල් වශයෙන් ප්‍රතිකාර සඳහා යොදා ගැනේ.

### 3.4 කිතුල් කර්මාන්තය පිළිබඳ පාරම්පරික දැණුම

තෝරා ගත් ප්‍රජාවන් ජීවත් වන්නේ ස්වභාවික සම්පතින් පොහොසත් ග්‍රාමීය ප්‍රදේශයන් වල වන අතර ඔවුන් ජීවත් වන ස්වභාවික පරිසර පද්ධතිය මත ඍජු වම යැපෙති. ඔවුන් පැවැත්ම සඳහා බාහිර යෙදවුම් යොදාගන්නේ අවම වශයෙනි.



**ඡායාරූප අනුග්‍රහය: නිමල් හේවානිල මහනුවර, ඉහළගම ලියන්ගස්වගුර ප්‍රදේශයේ පාරම්පරික කිතුල් මදින්නෝ ඇගැයීම් කටයුතු අතර පැවැති සාකච්ඡාවකදී.**

කිතුල් (*Caryota urens*)යනු තෙලි දිය නමින් හඳුන්වන මලෙන් ලබා ගන්නා පැණි රසැති යුෂයක් ද , කඳේ මෘදු මැද කොටසින් ආහාරයට ගත හැකි පිෂ්ඨය ද වටිනා දැවද තවත් බොහෝ ප්‍රයෝජනයන්ද ලබාගත හැකි බහු උපයෝගී ශාකයකි. කිතුල් සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ වගා නොකරනු ලබන ශාකයකි. එහෙත් දිවයින පුරා තෙත්, අතරමැදි ඇතැම් විට වියලි කලාපයේද සුලබව හමුවන කිතුල් බීජ ප්‍රචාරණය කරනු ලබන්නේ කල වැද්දන්, උගුඩුවන් හා මහනීලගොයා වැනි පක්ෂීන් මඟිනි. කලවැද්දා ප්‍රධාන වශයෙන් පැපොල්, වැල්දොඩම් , අන්නාසි වැනි පලතුරු හා කිතුල් වැනි ගෙඩි වර්ග ආහාරයට ගන්නා තුරු අතර සැරිසරන සත්ත්වයෙකි.



**ඡායාරූප අනුග්‍රහය: බුද්ධික මාවැල්ල**

**නීල මහගොයා (*Ducula aenea*) කිතුල් ගෙඩි බුදිමින් සිටින අවස්ථාවක් හා කලවැද්දා (*Paradoxurus zelonensis*). කිතුල් බීජ මව් ශාකයෙන් ඈතට ව්‍යාප්ත කරන්නේ මෙම සතුන්ය.**

මනා අන්තර් විශේෂ සහජීවන සබඳතාවයක් පෙන්නුම් කරන මෙම පරිසර ක්‍රියාවලිය මඟින් සතුන් කිතුල් බීජ ව්‍යාප්ත කරති. මිනිසුන් සාමාන්‍යයෙන් කිතුල් වගා නොකරන බැවින් කිතුල් යනු පාරිසරික වශයෙන් ඉතා නීරෝගී පරිසර පද්ධතියක් පෙන්නුම් කරන වටිනා දර්ශකයකි. සාමාන්‍යයෙන් කිතුල් මදින්නෝ ගසේ මුදුනින්ම හටගන්නා පළමු මල පදම් කොට තෙලිදිය නිපදවීමක් නොකරන අතර එය වතාවතක් ලෙස ගසේම තිබෙන්නට හරින්නේ දෙවි දේවතාවන්ට කැපකරනු ලබන පූජාවක් ලෙස සලකමිනි. වර්තමානයේ සමාජයේ පැණිරස අවශ්‍යතාවයන් ප්‍රධාන වශයෙන් සපයන උක් සීනි ජනප්‍රිය වන්නට පෙර එම ස්ථානය හිමිව තිබුනේ වඩා සෞඛ්‍යාරක්ෂිත විකල්පයක් ලෙස සැලකෙන කිතුල් පැණි සහ හකුරු වලටයි. දැනට සමාජයේ සුලබව දක්නට ඇති දෙවෙනි කාණ්ඩයේ දියවැඩියාවට මූලික හේතුවක් වන්නේ අධික සීනි භාවිතයයි. එහිදී කිතුල් මගින් ලැබෙන සීනි දියවැඩියාව කෙරෙහි ඇතිකරනු ලබන අවදානම උක් සීනි මගින් ඇතිකරන අවදානමට වඩා 35 ගුණයකින් පමණ අඩු බව සොයාගෙන ඇත.

### 3.4.1 කිතුල් මැදීමේ අරගලය කිතුල් පැණි මෙන් මිහිරි නැත.

කිතුල් මැදීම ඉහල ශ්‍රම අවශ්‍යතාවයක් ද ඇති අවදානම් ජීවනෝපායකි. කෙසේ වෙතත්, පලපුරුදු කිතුල් මදින්නෝ ප්‍රවේශමෙන් හා සකසුරුවමින් යුතුව සිය ජීවනෝපායේ නියැලෙති. කිතුල් මල් මැදීමේ ජීවනෝපාය සම්බන්ධව සුවිශාල දේශීය දැණුම් සම්භාරයක් ඇත. මල් මදින්නෝ මුලින්ම

තෙලිදිය ලබා ගැනීම සඳහා පදම් කිරීමට සුදුසු නොමේරූ මලක් තෝරාගෙන උන හෝ වෙනත් ශාක දඬු ආදිය යොදා ගනිමින් ගසට නැගීමට ආධාරකයක් සාදති. ඔවුන් පවසන්නේ කිතුල් මලක් තෙලිදිය ලබා ගැනීම සඳහා පදම් කර ගැනීමට දින ගනනාවක් ගත වන බවත්, එය ඉතා ඉවසීමෙන් හා මනා ප්‍රාගුණ්‍යයකින් කල යුතු බවයි. මල් පදම් කිරීම සඳහා ඔවුන් යොදා ගන්නේ මල් බෙහෙත් තැබීම් ශිල්ප ක්‍රමයයි. ඒ සඳහා යොදා ගන්නා විවිධ අමුද්‍රව්‍ය හා වනෞෂධ වර්ග 50 කට වැඩි සංඛ්‍යාවක් නිර්මාණී සංවර්ධන පදනම විසින් හඳුනාගෙන ඇත.




**ඡායාරූපය: මහේෂ් රූපසිංහ** **ඡායාරූපය: නිමල් හේවානිල**

පාරම්පරික ක්‍රමයට පදම්කරන ලද කිතුල් මලකින් වැඩි කාලයක් තෙලිදිය ලබා ගැනීමට හැකි වුවද, මෑතකදී රජය මඟින් හඳුන්වා දුන් කෘත්‍රිම රසායනිකයක් වන කැස්පර් ප්‍රතිකාරකය මඟින් ඉතා ඉක්මනින් මල පදම්කර ගැනීමට හැකි වුවත් වැඩි කාලයක් මල කපා තෙලිදිය ලබා ගැනිමට නොහැකි බව පවසති.

### 3.5 පාරම්පරික වී වගාකරන ප්‍රජාවන්ගේ පාරම්පරික දැනුම

### 3.5.1 පාරම්පරික වී වගාකරන ප්‍රජාවන්ට ඇති බාහිර හා අභ්‍යන්තර තර්ජන "ගැටළු ගස" නිර්මාණය කිරීමේ ක්‍රමවේදය යොදා ගනිමින් හඳුනාගන්නා අවස්ථාවක්




**ඡායාරූප: ලීල් රන්දෙනි**

වර්තමානයේ ශ්‍රී ලාංකිකයන්ගේ  ප්‍රෝටීන් හා කැලරි සපයන ප්‍රධානම ධාන්‍යය වන්නේ වී වලින් ලබා ගන්නා සහල්ය. කෙසේ වෙතත් පාරම්පරිකව ගොවීන් විසින් සංරක්ෂණය කොට පවත්වා ගෙන යනු ලබන සාම්ප්‍රදායික වී ප්‍රභේදයන්ට නව වැඩි දියුණු ප්‍රභේදයන්ට වඩා කරුණු කිහිපයක් හේතු කොටගෙන ජනතාව ප්‍රිය කරති. වෙළෙඳපොලේ සාම්ප්‍රදායික සහල් වල මිලද සාපේක්ෂව වැඩි මට්ටමක පවතී. කෙසේවෙතත් සාම්ප්‍රදායික වීවලට වඩාත් ප්‍රියකරන ගොවීන් ඒ පිළිබඳව විවිධ කරුණු ඉදිරිපත් කරති. සාම්ප්‍රදායික ප්‍රභේද සාපේක්ෂව උසින් වැඩි හා ප්‍රමාණයෙන් විශාල බැවින් වැඩි ජෛව ස්කන්ධයක් දරයි. ස්වභාවිකව සාමාන්‍ය තත්ව යටතේ හොඳින් වර්ධනය වන අතර කිසිදු කෘෂි රසායන භාවිතයකින් තොරව වගා කල හැක. සාම්ප්‍රදායික වී පසට වැඩි කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයක් එක් කරන බැවින් පසේ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කරයි. එමෙන්ම පාරම්පරික සහල් අත්‍යාවශ්‍ය ඛනිජ ලවණ හා විටමින් වලින් නව වැඩියුණු වී වල සහල් වලට වඩා කිහිප ගුණයකින් පොහොසත්ය. දැනට පාරම්පරික ගොවීන් සාම්ප්‍රදායික වී ප්‍රභේද 100 කට වඩා සංරක්ෂණය කොට ඇත.




**ඡායාරූප අනුග්‍රහය: නිමල් හේවානිල**

**වම්පස ඡායාරූපය:**  ඈතට පඩිපෙලක් මෙන් දිස්වන පාරම්පරික හෙල්මලු, වී වගා කිරීමට යොදා ගන්නා කුඹුරු මධ්‍ය කඳුකරය ආශ්‍රිතව හමුවන සුවිශේෂී කෘෂි පරිසර පද්ධතියකි. මිනිසා පරිසර පද්ධතිය සමඟ අනාදිමත් කාලයක් තිස්සේ සිය ආහාර නිෂ්පාදනය හා පරිසර කළමනාකරණයට මැදිහත් වීම නිසා නිර්මාණය වූ සමාජ-පරිසර විද්‍යාත්මක නිෂ්පාදන භූමි දර්ශනයක් ලෙස මෙම පද්ධති හැඳින්විය හැක. හෙල්මලු වී වගා කරන පරිසර පද්ධතින්, නාය යෑම්, පස්කඳු කඩා වැටීම්  වැනි ස්වාභාවික ආපදාවන්ට හොඳින් ඔරොත්තු දෙන සොබාදහමේ හා දේශගුණයේ වෙනස්වීම් හොඳින් දරාගත හැකි ස්ථායී පරිසර පද්ධතීන්ය. මෙහිදී හමුවන ක්‍රමවත් භූමි භාවිතය මඟින් ජල ප්‍රවාහයේ ගලායාම ක්‍රමවත්ව යාමනය කිරීම මඟින් හා පොළොවට උරාගැනීමට සැලැස්වීමෙන් නානායෑම් අවදානම අවම කරනු ලැබේ.

**දකුණු පස ඡායාරූපය:** කුඹුරු හිමිකාරිය විසින් සිය කුඹුරේ ගොයම් පැල සිටුවීමේ යෙදී සිටින අවස්ථාවකි. ශ්‍රී ලාංකිකයින් අතර සෑම කෙනෙකුගේම මූලිකම ජීවනෝපාය වන්නේ ගොවිතැන් කිරීමයි. ඔවුහු එය ගෞරවනීය රැකියාවක් ලෙස සලකන අතර, සිය ගොවිබිමේ වැඩ කිරීම අභිමානයක් ලෙස සලකති. කෙසේ වෙතත් ආර්ථිකය විවෘත කිරීම, සහල් ප්‍රධාන වෙළඳ භාණ්ඩයක් වීම, නාගරිකව ඇති සේවා ආර්ථිකයට හා ඇඟලුම් කර්මාන්තය වැනි රැකියාවන්ට ග්‍රාමීය ශ්‍රමය උරාගැනීම සහ ඇතැම් රාජ්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් පාරම්පරික වී වගා කිරිමේ ජීවනෝපාය තර්ජනයට ලක්වී ඇත. දේශගුණික විපර්යාස ඇතිවීමේ තීව්‍රතාවයද වැඩි වී ඇති අතර ඒ සඳහා මුහුණ දීමට විධිමත් වැඩ පිළිවෙලක් නොමැති වීමද ඉහත අර්බුදය තීව්‍ර වීමට හේතු වී ඇත.

### 3.5.2 සාම්ප්‍රදායික වී වගාකරන මානව නිර්මිත තෙත්බිම් භූමි දර්ශන ගමේ පිරිමින් අතින් පමණක් නොව ගැහැණුන් අතින්ද සැකසේ.



**ඡායාරූප අනුග්‍රහය : නිමල් හේවානිල**

**වම් සේයාරුව -** කාන්තා ශ්‍රමය පාරම්පරික වී වගා කටයුතු වලදී ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට බොහෝ සෙයින් වැදගත් වේ. අතීතයේදී ගෙවිලියෝ වී වගා කටයුතු වලදී ඔවුන්ට පැවරුනු කාර්යයන් විනෝදයෙන් කවි කියමින් සිදුකොට ඇත. සූර්යයා දේවත්වයේ ලා සැලකූ ඔවුන් ඒ කටයුතු සඳහා මහත් ආශාවෙන් සහභාගි වී ඇත. කෙසේ වෙතත් නූතන කාර්මීකරණයත් සමඟ මෙවැනි සමාජයට හිතකර ජීවනෝපායයන් හා ක්‍රියාකාරකම් නෂ්ට වෙමින් පවතී.

**දකුණු සේයාරුව -** වී වගාව වැනි පාරම්පරික ජීවනෝපායයන් හා බැඳුනු සාම්ප්‍රදායික ඇදහිලි හා විශ්වාස බොහොමයක් ඇත. ප්‍රජාවේ ගැමියන් විවිධ වතාවත් අනුගමනය කරමින් සාර්ථක අස්වැන්නක් ලබාගැනීමට තම වගාව ආරක්ෂා කර දුන් දෙවි දේවතාවුන්ට පින් පෙත් අනුමෝදන් කිරීම් හා තුති පිදීම් කරති. මෙවැනි ජන උත්සව, යාතුකර්ම හා වතාවත් ආදිය නූතනත්වයත් සමඟ භාවිතයෙන් ඉවත් වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ ඉතා වටිනා පැතිකඩක් වන මෙවැනි අතීත උරුමයන් සුරැකීම, දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භයන් සම්බන්ධයෙන් බෙහෙවින් වැදගත් වේ.

## 3.6 උපදේශන පරීක්ෂණයක්, නැවුම් නවෝත්පාදක ශිල්ප ක්‍රම යොදා ගනිමින් පරිසර මිතුරු ජීවන රටා පණ ගැන්වීම සඳහා අනොයා්න්‍ය බෙදාහදා ගැනීම් හඳුන්ව දීම.



**ඡායාරූප: ලීල් රන්දෙනි**

**වම්පස ඡායාරූපය:** පාරම්පරික වී වගාකරන ප්‍රජාවේ කාන්තාවන් විසින් ආහාර හා ශ්‍රමය හුවමාරු කර ගැනීමට හා බෙදා හදා ගැනීම් ක්‍රම පන ගැන්වීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද පර්යේෂණයකට සිය දායකත්වය දැක්වූ අවස්ථාවකි. ප්‍රජා දෘෂ්ඨිවාදය තුල බුලත් සඳහා විශේෂ ස්ථානයක් ඇත. ඒවා සුබ කටයුතු වලදී යොදා ගන්නා පූජනීය ද්‍රව්‍ය ලෙස සැලකේ. මෙහිදී මෙම කාන්තා කණ්ඩායම ආහාර මණ්ඩලයක් නිර්මාණය කිරීම සඳහා විශේෂයෙන් පිළියෙල කරන ලද මේසයක් මත බුලත් කොල අතුරමින් සිටිති. ආහාර මණ්ඩල සැකසීමෙන්, ආහාර සංස්ලේෂණයට ශක්තිය සපයන, මූලික ශක්ති ප්‍රභවය වන සූර්යයාට තුති පිදීම හා හිරුගෙන් හා ස්වභාවයෙන් ලද ත්‍යාගයක් ලෙස සලකා උත්සවාකාරයෙන් සැමරීම සංකේතවක් කරයි.

කලනි පෙරේරා මෙනවිය, වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිව්‍යාපාර කළමණාකරන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන අවසන් වසරේ උපාධි අපේක්ෂිකාවකි. ඇයගේ පර්යේෂණ ව්‍යාපෘතිය වන්නේ කාලීනව හමුවන පළතුරු හා එළවලු, පලාවර්ග අමුද්‍රවය ලෙස යොදා ගනිමින්, අතීතයේ පැවති විකල්ප ආර්ථිතයක් වන බෙදාහදා ගැනීම් ආර්ථිකය නැවත ගොඩ නගා සිටුවීමට ශක්‍යතාවයක් ඇත් දැයි සොයා බැලීමයි.

මෙය ශ්‍රී ලංකාවේ දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භයන් පිළිබඳ ව්‍යාපෘතියෙන් ගොඩ නැගුනු සබඳතා යොදාගෙන ස්වේච්ඡා සේවා සැපයීමට කදිම නිදසුනකි.

**දකුණු පස ඡායාරූපය:** ශ්‍රී ලංකාවේ ග්‍රාමීය භූමිදර්ශනයන්හි, දැනට බොහෝ සෙයින් නොසලකා හරින ලද පළතුරු හා එලවලු විවිධත්වයෙන් යුතුව ඉතා සුලබව හමුවේ. කාලීනව සුලබවන එම පරිසර පද්ධති භාණ්ඩයන් පරිභෝජනය කිරීම මඟින් ආහාර සැපයුම හා කාබන් පියසටහන් කිහිප ගුණයකින් අවම කර ගත හැක. එමඟින් දරාගැනීම් සඳහා සංරක්ෂණයේ දායකත්වය වැඩි දියුණු කල හැක. බොහෝ තරුණ ප්‍රජාවන්, එම එළවලු හා පළතුරු ගඩා ගෙඩි ආදිය ගැන දැනුවත්නොවෙති. ආහාර මණ්ඩල නිර්මාණය සිදුකරන්නේ කාලයට සුලබවන වගා කරන හා නොකරන ආහාර ද්‍රවය යොදා

ගනිමින් සාමූහිකයවයි. මෙම ක්‍රියාකාරකම අතරතුර අවබෝධ වූයේ දැනුම හුවමාරු කරගැනීමට මහා වේදිකාවක් ලෙස ආහාර මණ්ඩල සැකසීම උපයෝගී කොට ගත හැකි බවයි.

ඉහත ක්‍රියාකාරකම් මෙම ව්‍යාපෘතියේ මැදිහත් වීමක යහපත් ප්‍රතිපලයක් ලෙස පෙන්වා දිය හැකිය.

**3.7 දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භයන්ට ඇති අභ්‍යන්තර හා බාහිර තර්ජන**

ප්‍රජාවේ අභිවෘද්ධිය සඳහා කැපී පෙනෙන අභ්‍යන්තර බාධකයක් ලෙස හඳුනා ගැනුනේ සංස්කෘතික තහංචියක් වූ පාරම්පරික දැනුම රහස් ලෙසින් පවත්වා ගැනීමට පෙළඹීමයි. මෙය පාරම්පරික සර්ප විෂ වෙද මහතුන් හා සම්බන්ධයෙන් ප්‍රබල වශයෙන්ද, කිතුල් මැදීමේ ප්‍රජාවන්ගේ සුළු වශයෙන්ද නිරීක්ෂණය විය. මෙය කට වහරේ “දැන කරනු පිට නොදෙනු” යනුවෙන් ව්‍යවහාර වේ.

පාරම්පරික දේශීය දැනුම නැතිවී අහෝසි වී නෂ්ට වී යාම තීරණාත්මක අභ්‍යන්තර තර්ජනයක් ලෙසින් හඳුනා ගැණිනි. අළුත් පරම්පරාවන් පාරම්පරික දේශීය දැනුම පිළිබඳව උනන්දුවක් නොදක්වන බව ප්‍රජාවේ අදහසයි. මෙය ඍජුවම අභ්‍යන්තර තර්ජනයක් පමණක් නොවන බවත් එම තත්වය තීව්‍ර කිරීමට බාහිර තර්ජනයන්ද දායක වන බව ඔවුහු කල්පනා කරති. වෙළෙඳපොල නිදහස් ආර්ථික සංකල්ප හඳුන්වා දීමත් සමඟම නාගරික ප්‍රදේශ සීඝ්‍ර දියුණුවකට යාමත් සමඟම වැඩි වැටුප් ලැබෙන, එතරම් වෙහෙස වීම අවශ්‍ය නොවන රැකියා එම ප්‍රදේශවල සුලබ විය. තරුණ පරම්පරාව එම රැකියා වෙත වැඩි වැඩියෙන් ඇදී යාමත් සමඟම ග්‍රාමීය ජීවනෝපායයන් අඩාල වී දේශීය පාරම්පරික දැනුමේ උන්නතියට මරු පහරක් වැදුනි. සාමාන්‍ය මට්ටමින් වත් අධ්‍යාපනය ලැබීමට නොහැකි වූ තරුණයින් වෙනත් විකල්ප නොමැති බැවින් ගොවිතැන් කිරීම, කිරි ගවයින් ඇති කිරීම වැනි සත්ත්ව පාලන කටයුතු හා කිතුල් කර්මාන්තය ජීවනෝපායයන් ලෙස තෝරා ගත්තත් එහි ආකර්ෂණීය බව මද බැවින් තිරසාරව රැඳීමක් නොමැත. ඔවුහු බොහෝ විට වෙනත් වැඩි වැටුප් රැකියාවක් ලැබෙන තෙක් මෙම ජීවනෝපායයන් හි නියැලෙති. එමෙන්ම පොදුවේ ග්‍රාමීය ජීවනෝපායයන්ගෙන් ලැබෙන ආදායම අඩුවීම පමණක් නොව එහිදී ඔවුනට අවදානමකට හා අඩමානයකටද මුහුණ දීමට සිදුවේ. මෙහේතුවෙන් ග්‍රාමීය ජීවනෝපායයන් දුර්වල වීමත් දේශීය පාරම්පරික දැනුම අහිමි වී යාමටත් හේතුවී ඇත. ග්‍රාමීය ප්‍රෙද්ශ වල ජනතාව දිළිඳු බවේ විෂම චක්‍රය වෙත තල්ලු වී යාමට හා කල් පවත්නා අයුරින් පහත් ජීවන තත්වයක් උරුම වීමට හේතු වී ඇත.



**ඡායාරූප අනුග්‍රහය: ලීල් රන්දෙනි**

**නිර්මාණී සංවර්ධන පදනමේ විධායක අධ්‍යක්ෂ නිමල් හේවානිල මහතා සාම්ප්‍රදායික වී වගාකරන ගොවි ප්‍රජාවන් සමඟ ඔවුන් මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම සඳහා ගැටළු ගස සහභාගිත්ව ගැමි ඇගැයුම් ශිල්ප ක්‍රමය යොදා ගනිමින් කතිකාවේ නියැලී සිටින අවස්ථාවක්.**

ඇගැයීමට භාජනය කරන ලද ප්‍රජාවන් තුනෙහිම දැනටමත් පාරම්පරික ජීවනෝපායයන්හි යෙදෙන වැඩිහිටියන් බොහෝ දෙනෙකුගේ අදහස වූයේ **පුරාණයේ සිට පැවත එන සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර, දෙවි දේවතාවුන් සම්බන්ධ ඇදහිලි විශ්වාස, මලවුන්ට පින්දීම්, අභිචාර , වතාවත් - පුද පූජා ආදිය අනුගමනය නොකිරීම** පාරම්පරික ජීවනෝපායයන්ගේ පරිහානියට දරුණු ලෙස බලපා ඇති බවයි. අදෘශමාන බලවේග සතුටු කිරීම ප්‍රජා ජීවනෝපායයන් ගෙන් තිරසාර ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය බව ඔවුහු අවධාරනය කලහ. පාරම්පරික කිතුල් මැදීම හා සම්බන්ධ වැදියක් පූජාව, වී වගාවේ අස්වනු ලබා ගැනීමෙන් පසු සිදු කරන කංකාරි හා අළුත් සහල් මංගල්‍ය පැවැත්වීම, පාරම්පරික සර්ප විෂ වෙද ගුරුකුල වල පරම්පරාවේ පෙර ගුරුවරුන්ට පින් පෙත් අනුමෝදන් කිරීම නිදසුන් ලෙස දැක්විය හැක.

**දියුණු වීම සඳහා උන්නතිකාමී මානසිකත්වයක් නොමැති වීම හා ව්‍යාපාරික විඥානයකින් කටයුතු නොකිරීමද** ඇගැයීම් වලදී හඳුනාගත් අභ්‍යන්තර තර්ජනයකි. ඉහත මානසික ලක්ෂණය පොදුවේ ප්‍රජාවන් 03 තුලම නිරීක්ෂනය විය. ඔවුන් සිටින ආන්තික ආර්ථික තත්වයෙන් මිදීමට උත්සාහ නොකෙරෙන්නේ එබැවිනි.

**පුරාණයේ සිට පැවතෙමින් තිබූ අන්‍යෝන්‍ය හුවමාරු දීම් ලැබීම් ආර්ථිකය (Reciprocal Economy) දුර්වල වීම තර්ජනයක් ලෙසින් හඳුනා ගැණිනි.** මුදල් භාවිතය සුලබ නොවූ ඈත අතීතයේ සිට ශ්‍රී ලාංකිකයින් අතර භාණ්ඩ හා ශ්‍රමය හුවමාරු වීම ග්‍රාමීය ආර්ථිකයේ අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය පදනම් කරගෙන සිදුවෙමින් පැවතී ඇත. මෙම ප්‍රජාවන් අතුරින් මෑතක් වනතුරු පාරම්පරික වී වගා කිරීමට අදාළව බිත්තර වී හුවමාරු කරගැනීම, අත්තම් ක්‍රමයට ශ්‍රමය හුවමාරු කර ගැනීම,

සීසෑම් කොළ මැඩවීම් කටයුතු වලදී සත්ත්ව ශ්‍රමය හුවමාරු කර ගැනීම ආදිය සිදු වී ඇතත් එවැනි සබඳතා සීඝ්‍ර පරිහානියකට පත් වෙමින් යයි. විවෘත වෙළෙඳපොල මුදල් පාදක භාණ්ඩ හා සේවා හුවමාරු ක්‍රම වැළඳ ගැනීමත් සමඟම ප්‍රජාවේ ජනතාව හුදකලා වීම සිදුවිය. තනි තනිව ආත්මාර්ථකාමී අයුරින් ක්‍රියාකිරීමටත්, එකිනෙකා විශ්වාස නොකිරීමටත් පෙළඹීම නිසා ජීවනෝපාය සම්බන්ධ බෙදාහදා ගැනීම් දුර්වල වී ඇත. මේ අයුරින් පාරම්පරික ජීවනෝපායයන්ට අත්‍යාවශ්‍ය වූ සමාජ සබඳතාවයන් පරිහානියට පත් වීම වැදගත් අභ්‍යන්තර තර්ජනයක් ලෙස හඳුනා ගැනුනි

**පවතින රාජ්‍ය යාමන යාන්ත්‍රනයේ හා නීති රාමුවේ තිබෙන හිදැස් නිසා ඇතිවී තිබෙන බාධාවන් ප්‍රජාවන් හඳුනාගත් වැදගත් බාහිර තර්ජනයකි.** එහිදී ඔවුන්ගේ ජීවනෝපායයන් නොසලකා හැර හෝ ප්‍රමාණවත් අවධානයක් යොමු කොට නැතැයි ඔවුහු චෝදනා කලහ. කිතුල් මදින්නන් පවසන අන්දමට පැණි හකුරු නිපදවීමට අවශ්‍ය වන තෙලිදිය නිපදවීම නීති විරෝධී නොවුනද, ඇතැම් අවස්ථාවලදී නීති විරෝධී රා නිපදවන්නේ යැයි චෝදනා කොට නීතියේ රැහැනට හසුකොට දඩ මුදල් ගෙවීමට පවා ඇතැමුන්ට සිදුවී ඇත. මෙය ඔවුන් තම පාරම්පරික ජීවනෝපායයේ යෙදීම අධෛර්යයට පත් කරවන කරුණකි.

පාරම්පරික සර්ප විෂ වෙද මහතුන් පවසන්නේ සර්ප විෂ ගල වැනි ජෛව සංස්කෘතික නිෂ්පාදන වෙළෙඳපලට හඳුන්වා දීමේදී පාරම්පරික ක්‍රමවේදයන්ට අනුව එම නිෂ්පාදන වල ඵලදායී බව හා ප්‍රමිතිය ඔප්පු කර නීත්‍යානුකූල අවසර ලබා ගැනීමට ක්‍රමවේදයක් නොමැති වීම බලවත් බාධාවක් බවයි. දැනට ඇති බටහිර ඇලොපති වෛද්‍ය පර්යේෂණ හා නිර්ණායක පාරම්පරික වෛද්‍ය ක්‍රමය හා නොගැලපෙන බව ඔවුන් අදහස් කරති.

**කිතුල් කර්මාන්තය සඳහා මෑතකදී හඳුන්වා දුන් කැස්පර් රසායනික ප්‍රතිකාරක ක්‍රමය නොගැලපෙන තාක්ෂණයක් හඳුන්වා දීම නිසා බේදවාචකයක් වී ඇති බවත්,** ඇතැම් පාරම්පරික මල් මදින්නන් ගේ ආදායම් අඩුවී කර්මාන්තයේ තිරසාර පැවැත්මට බරපතල තර්ජනයක් වී ඇතැයි පැවසුනි. කැස්පර් ප්‍රතිකාරකය මඟින් කෙටි කාලයකින් මල් පදම් කර ගත හැකි වුවද මල කැපීමට හැක්කේ මාස කිහිපයක් පමණි. එයට වෙනස්ව පාරම්පරික මල් බෙහෙත් තැබීමේ තාක්ෂණයේදී මල පදම් වූ ආකාරය අනුව ඇතැම් විට වසර එකහමාරක් පමණ වුවද කැපීමට හැක. කිහිප ගුණයකින් වැඩි තෙලිදිය අස්වැන්නක් ද ලැබිය හැක. කැස්පර් යොදා මල් පදම් කල කිතුල් ගස්වල පිටිද ඉතාඅඩු බවද මල් මදින්නෝ පැවසූහ.

**සීනි,පොල් පැණි වැනි පැණි රසැති වෙනත් ආදේශක මිල අධික අව්‍යාජ කිතුල් නිෂ්පාදන සඳහා ඇති වෙළෙඳපොල අවස්ථා උදුරා ගැනීම** ඇගැයීම් කටයුතු වලදී එළිදරවු වූ තවත් බාහිර තර්ජනයකි. හතු පිපෙන්නාක් මෙන් වෙළෙඳපොලට හඳුන්වා දෙන මේ ව්‍යාජ නිෂ්පාදන කිතුල් නිෂ්පාදකයින් අධෛර්යමත් කිරීමට හේතු වී ඇත.

**රාජ්‍ය අනුග්‍රහය ප්‍රමාණවත් නොවීම බාහිර තර්ජනයකි.** පාරම්පරික සර්ප විෂ වෙද මහතුන් පවසන්නේ ඔවුන් නිහඬව සමාජයට ඵලදායී සේවයක් ඉටුකලද රජයෙන් ඔවුනට සිය ජීවනෝපාය සඳහා ප්‍රමාණවත් දිරිගැන්වීමක් නොලැබෙන බවයි. බටහිර වෛද්‍යවරුන්ට රජයෙන් වරප්‍රසාද ලබා දීම පිළිබඳව ඔවුන් විරුද්ධත්වයක් නැතත් සිය වෘතිය සඳහාද ප්‍රමාණවත් අගය කිරීමක් ලැබිය යුතුයැයි කියති. සර්ප විෂ සම්බන්ධයෙන් ගත් කල ඔවුන්ගේ ප්‍රතිකාර ක්‍රම පරිසරයට හා රෝගියාට හිතකර හා කල් පවත්නා අහිතකර බලපෑම් ඇති නොකරන බව පවසති. බටහිර ඇලොපති වෛද්‍යක්‍රමයේ ස්වභාවය අනුව එහිදී පරිසරයේ ඇති ගස්වැල් වල කොල පොතු ආදිය නැවුම්ව ප්‍රතිකාර සඳහා යොදා නොගැනේ. කාර්මිකව නිෂ්පාදනය කරන ලද පෙති,කරල් මිල අධික බැවින් ඇලොපති ප්‍රතිකාරක විධි මිල අධිකය. බටහිර ඇලොපති ක්‍රමයේ ඖෂධ මඟින් ආසාත්මිකතා ඇතැම් විට ඇතිවෙන අතර විෂ වීම් සිදුවී අක්මාව හා වකුගඩු වලට බලපෑම් ඇතිවූ අවස්ථාවන්ද ඇත. බටහිර වෛද්‍ය ක්‍රමයේ සර්ප විෂ ප්‍රතිකාරයේදී බොහෝ ඖෂධ සිරුර තුළට එන්නත් මඟින් ඇතුල් කිරීම සිරුරට දිගුකාලීනව අහිතකර බව පාරම්පරික වෛද්‍යවරුන් පැවසුහ.පාරම්පරික ක්‍රමයේ විවිධ ප්‍රතිකාර විධි ගණනාවක් තිබෙන බවත්,සිරුර තුළට ඇතුල් කරන්නේ ශාකමය දේ බැවින් අහිතකර නොවේ. බටහිර වෛද්‍ය ක්‍රමයේදී දෂ්ඨ කරන ලද සර්පයා හඳුනා ගැනීම අත්‍යාවශ්‍ය බැවින් ඇතැම් අවස්ථාවල නිරපරාදේ සතුන් මරා දැමීමට ඇතැමුන් පෙළඹී සිටිති. සර්පයින් පරිසරයේ ස්වස්ථතාවය හා නීරෝගීභාවය පිළිබඳ දර්ශකයන් වන අතර ඔවුන් පාරිසරික සමතුළිතතාවය සඳහා අනිවාර්යයෙන් සංරක්ෂණය කලයුතු ජීවීන් කොට්ඨාශයක් බව පාරම්පරික වෛද්‍යවරුන්ගේ අදහසයි. දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ ව්‍යායාමයෙහිලා පාරම්පරික වෛද්‍ය ක්‍රමය බොහෝ ඉදිරියෙන් ඇතත් රජයෙන් ඔවුනට ඇති සැලකිල්ල, පිළිගැනීම හා දිරිගැන්වීම නොමැති වීම පාරම්පරික වෛද්‍යවරුන්ගේ කණස්සල්ලට හේතු වී ඇත.

**දැනට රජය මඟින් ක්‍රියාත්මක කරන වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ක්‍රමය ඔවුනට කරදරකාරී ක්‍රමයක් බැවින් ඔවුන් ඒ ගැන කලකිරීමෙන් සිටින බවක්ද පැවසුනි.** ඔවුන් පවසන්නේ ලියාපදිංචිය ලබා දීමට අවශ්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන පරීක්ෂක මහතුන්ට ඔවුන්ගේ ප්‍රතිකාර ක්‍රම ගැන අවබෝධයක් නොමැති බවයි. එමෙන්ම ඔවුනට ඒවා ගැන විශ්වාසයක් ද නැත. වෛද්‍ය අධ්‍යාපනයේදී බටහිර ඇලොපති වෛද්‍ය ක්‍රම සඳහා විධිමත් අධ්‍යාපනයේදී වැඩි පිළිගැනීමක් ලබා දී ඇතත්, දේශීය පාරම්පරික දැනුම නොසලකා හැර තිබීමද ඔවුන්ගේ සිත්තැවුලට හේතු වී ඇත. දැනුම අනාගත පරම්පරාවලට උරුම කරදීමේ බාධා ඉවත් කිරීම අත්‍යාවශ්‍ය ප්‍රමුඛ කාර්යයක් ලෙස ඔවුන් සලකති.

## 4. නිගමන හා යෝජනා

**ප්‍රජාවන් සමඟ සිදුකල කතිකාවන් හා අභ්‍යාසයන් අවසානයේ ඔවුන් විසින් හඳුනාගත් තර්ජන ඉවත් කිරීම සඳහා විසඳුම් අරමුණු කරගත් ප්‍රවේශයන්, උපායමාර්ග හා ප්‍රතිපත්තීන් සැකෙවින් දක්වා ඇත.**

- විසඳුම් අරමුණු කරගත් ප්‍රවේශය අනිවාර්යයෙන්ම සාකල්‍ය ප්‍රවේශයක් (Holistic Approach) විය යුතුය. එහිදී ප්‍රජාව වෙතින් නැඟුනු ඔවුන්ගේ සැබෑ අවශ්‍යතාවන්ට ප්‍රමුඛතාවය යුතුය.

- ප්‍රජාවන්ගේ හමුවෙන දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ ක්‍රියාකාරකම් හඳුනා ගැනීමත් අගය කිරීමත් සිදුවෙන සමාජ සන්දර්භයක් නිර්මාණය කල යුතුය. පවත්තා ගැටළු විසඳීමට මනා ලෙස ගොණු කරන ලද ,ශක්තිමත් රාජ්‍ය ප්‍රතිපත්ති  මෙහිලා අත්‍යාවශ්‍ය පූර්ව කොන්දේසියකි.

- මෙහිදී පොදුවේ ප්‍රජාවන් 03 ටම අදාළ වන ප්‍රවේශයන්, උපායමාර්ග හා ප්‍රතිපත්තීන් පළමුවෙන් දක්වා ඇත.

- රාජ්‍ය මැදිහත් වීම් මඟින් දැනට ඇති යාමන හා නීතිමය බාධාවන් ඉවත් කිරීම. මෙහිදී කිතුල් මදින්නන්ට ඇති නීතිමය බාධා ඉවත් කොට ඔවුනට නිදහසේ සිය කර්මාන්තයෙහි නියැලීමට ඉඩහසර නිර්මාණය කල යුතුය. එයින් නොනැවතී ඔවුන්ට දිරිගැන්වීම් ආදිය සුලබ කල යුතුවේ. එමෙන්ම පාරම්පරික ජෛව සංස්කෘතික නිෂ්පාදන වලට විකල්ප ලෙස හතු පිපෙන්නාක් මෙන් වෙළෙඳපොල ආක්‍රමණය කරන බාල නිෂ්පාදන දඩ ගැසීම් වැනි දැඩි නීතිමය මෙවලම් යොදා පාලනය කල යුතුය.

- සර්ප විෂ ගල වැනි ජෛව සංස්කෘතික නිෂ්පාදන වල ඵලදායි බව හා ප්‍රමිතිය නිර්ණය කිරීම සහ ප්‍රවර්ධනය සඳහා ප්‍රජා පාදක ක්‍රමවේද නිර්මාණය කල යුතුය.

- සාම්ප්‍රදායික වී වර්ග වගා කරන්නන්ගේ පරිසර හා ජෛව විවිධත්ව මිතුරු හැසිරීම ප්‍රවර්ධනය සඳහා ගැලපෙන උපායමාර්ගික මෙවලම් සකස්කොට ක්‍රියාත්මක කල යුතුය.



**ඡායාරූප අනුග්‍රහය : නිමල් හේවානිල**

**සර්පවිෂ ගල නමින් හඳුන්වන්නේ සර්ප විෂ දෂ්ඨ කිරීමකදී එම සර්ප විෂ සිරුර පුරා පැතිරීම වැළැක්වීමට සර්පයා කෑ මුඛයේ තැබීමට යොදා ගත හැකි විෂ ඇදීමට යොදා ගන්නා ඖෂධ වර්ග යොදා සැකසූ ගලක් වැනි ඝන ද්‍රව්‍යයකි. පාරම්පරික සර්ප විෂ වෛද්‍යවරුන් දැනට මෙම විෂ ගල නිපදවා ඇතත් බොහෝ දෙනෙකුට සෙතක් සැලසෙන ලෙසින් වෙළෙඳපොලට හඳුන්වා දීම සඳහා බාධක ඇත.**

**ප්‍රජාවන් ජෛව සංස්කෘතික ප්‍රජා ප්‍රඥප්තීන් වැනි අන්තර් ජන්‍ය ක්‍රම වේදයන් යොදා ගනිමින් ඇතුළතින් ශක්තිමත් කිරීම.** ප්‍රජාවේ අවශ්‍යතාවයන් ජාතික හා ගෝලීය ප්‍රමුඛතාවයන් සමඟ සහක්‍රියාවකට (synergy) ගොණු කිරීම මඟින් සැවොම දිනන ප්‍රතිපල අත්පත් කරගත හැකි සන්දර්භයක් නිර්මාණය කල හැකිය. ප්‍රජාව සතු පොදු ජෛව සංස්කෘතික උරුමය ඔවුන් ලවාම සිතියම් ගත කිරීම නිර්මාණය මඟින් සාර්ථක අයුරින් සිදු කල හැකිය. ප්‍රජාවට සම්පත් ඒකරාශීකරණය සඳහා නවෝත්පාදන ක්‍රමවේදයන් ආකාර ගණනාවකටම ඉඩහසර විවෘත කරයි. මේ මඟින් සාම්ප්‍රදායික දැනුම පරිහානියට පත්වීම නවතාලිය හැකිය. එක්සත් ජාතීන්ගේ ජෛව විවිධත්ව සම්මුතියට අත්සන් තබා ඇති පාර්ශ්වකාර රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව ජෛව විවිධත්වය සංරක්ෂණ කිරීමෙන් හා තිරසාර අයුරින් භාවිතයට ගැනීමෙන් ඇතිවන ප්‍රතිලාභ සමාන හා සාධාරණ අයුරින් ජනතාව අතර බෙදාහදා ගැනීමට අදාළ නගෝයා සන්ධානයට අත්සන් කිරීමට සැරසෙන බැවින්, එම සන්ධානයේ ක්‍රියාකාරකම් සඳහා අත්‍යාවශ්‍ය හා වඩා ප්‍රතිඵලදායී වනු ඇත.

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය කළමනාකරණයට මාර්ගෝපදේශ සපයන ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (2016-2022) මඟින් ද ප්‍රජා ජෛව සංස්කෘතික ප්‍රඥප්ති නිර්මාණය කිරීම ප්‍රජාව සතු ජෛව විවිධත්වයන් ජාතික ආර්ථිකයට අනුප්‍රවාහගත කිරීම සඳහා ප්‍රයෝජනවත් මෙවලමක් ලෙසින් නිර්දේශ කොට ඇත.  මෙමඟින් දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා රාජ්‍ය අනුග්‍රහය හා අන්තර්ජාතික වශයෙන් ආධාර උපකාර ලබාගත හැක.

**ප්‍රජාව පැත්තෙන් ඉතා සහනදායක උපායමාර්ගික මෙවලම් ලෙස හඳුනාගත හැකි නො-වෙළෙඳපොල ආකාරයේ හුවමාරු ක්‍රම සඳහා පහසුකම් සැලසීම.** ඒ සඳහා දුරාතීතයේ සිට පැවත එන දීම් ලැබීම් ආකාරයේ අන්‍යෝන්‍ය හුවමාරුආර්ථික ක්‍රම පුනර්ජීවනය කිරීමත් එවැනි නව ක්‍රම හඳුන්වා දීමත් ප්‍රයෝජනවත් වේ. පාරම්පරික බීජ,දැණුම හා උපකරණ මෙලෙස පොදුවේ බෙදා හදා ගැනීමේ ක්‍රම හඳුන්වා දීම සඳහා යෝග්‍ය වේ.

.

**ස්ත්‍රී-පුරුෂ සමාජ භාවයන් අතර සමානත්වය (Gender Equity) ඇතිවන ආකාරයෙන් ප්‍රජාවට පහසුකම් සැලසීම.** මෙහිදී පාරම්පරික ජීවානෝපායන්ට අදාළව ස්ත්‍රී පුරුෂ සමාන තත්වයන් ඇතුළත් වී තිබෙන බවට ප්‍රජා නියෝජිතයින්ගේ අදහස විය. සමාජ භූමිකාවන් සැම විසින් ගෞරවනීය අයුරින් සැලකුම් ලබා ඇත. පාරම්පරික වශයෙන් කාන්තාවන්ට ග්‍රාමීයව හිදිමින් ආරක්ෂිත රැකියා වල යෙදී ප්‍රමානවත් තරම් ආදායමක් ලබා ලබාගැනීමට පාරම්පරික ජීවනෝපායන් මඟින් ඉඩ හසර සලසන බව ගම් වැසියන්ගේ අදහසයි.

**වර්ථමානයේ ග්‍රාමීය කාන්තාවගේ සමාජ තත්වය ඛේදජනක යැයි ඔවුන් අදහස් කරති.** ජීවත්වීමට සරිලන ලෙස ප්‍රමාණවත් ආදායමක් ලබාගැනීමට හැකි රැකියා දේශීය වශයෙන් සුලබ නොවන බැවින්, ඔවුන්ට සිය නුපුහුණු ශ්‍රමය මෙහෙකාරකම්, බැල මෙහෙවර වැඩ සඳහා මැද පෙරදිග වැනි රටවලට දීමට සිදුවී ඇත. එවැනි බොහෝ පවුල් විවිධ ආකාරයේ ගැටළු වලට මුහුණ දී සී සී කඩ විසිර ගොස් ඛේදජනක ඉරනම් වලට මුහුන දී ඇත.

**විසඳුම නම් නව්‍ය ක්‍රමෝපායන් යොදා ගනිමින් කාන්තාවන්ට මෙරටෙහිම හිදිමින් සිය අපේක්ෂාවන් ඉටුකර ගැනීමට ප්‍රමාණවත් ආදායම් ලබාගෙන සතුටින් සිටීමට හැකි රැකියා නිර්මාණය කිරීමයි.** පාරම්පරික ජීවනෝපායන් පුනර්ජීවනයට ලක් කිරීමෙන් එය ඉටුකල හැකි බව ප්‍රජාවගේ අදහසයි.

**ග්‍රාමීය ආර්ථිකය තුල තිරසාර ජීවනෝපායන් ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වන ආයෝජනයන් සිදු කිරීම සඳහා පුද්ගලික අංශයට පහසුකම් සැලසීම, කිතුල් ගස් නැගීම අවදානම් කටයුත්තකි,** ඒ සඳහා පහසුවෙන් ගස් නැගීමට හැකි වන සේ තාක්ෂණික වැඩි දියුණු කිරීම් හා නවෝත්පාදන සිදු කිරීම සඳහා දිරි ගැන්වීම් ඇති කිරීම.

නව උපායමාර්ගික සංරක්ෂිත මෙවලමක් හඳුන්වාදීමට ඇගයීම සඳහා ජීවනෝපායන් උපයෝගී කොට ගැනීම.

**සංරක්ෂණ ගිවිසුම්, පරිසර පද්ධති සේවා සඳහා ගෙවීම් ක්‍රම, වැනි නව පාරිසරික ගිවිසුම් ගත එකඟතාවයන් හඳුන්වා දීම.** මෙහිදී ජෛව විවිධත්වයෙන් ප්‍රසිද්ධ බ්‍රසීලයේ අත්හදා බලා සාර්ථක වී ඇති පරිසර විද්‍යාත්මක පිස්කල් ප්‍රතිසංස්කරණ වඩාත් සුදුසු මෙවලමක් ලෙස හඳුනා ගත හැක.

දරා ගැනීම් සඳහා ප්‍රජා සංරක්ෂණ මූලාරම්භකයන් ශ්‍රී ලංකාවේ දැනටමත් ක්‍රියාත්මක වන නීල හරිත ලස්සන ලංකා ගම්මාන වැඩ සටහන වැනි හරිත සංවර්ධන මූලාරම්භකයන් සමඟ ඒකාබද්ධ කිරීම.

**බාහිර පාර්ශ්ව කරුවන් සඳහා මූලික නිර්දේශ;**

- **ප්‍රජාවේ සංරක්ෂණ කටයුතු පිළිබඳ පුළුල් වශයෙන් ජාතික මට්ටමේ කතිකාවක් ගොඩ නැගීම සඳහා සුදුසු වේදිකාවක් ගොඩ නැගීම,** එමෙන්ම එය ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වන ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් පදනම් කර ගත් දැනුම බෙදා හදා ගන්නා කතිකා වේදිකාවන් සමඟ ජාලගත කිරීම, ගෝලීය වශයෙන් දේශගුණ විපර්යාස හා ආපදාවන්ට මුහුණ දීම සඳහා වන දරාගැනීම් මූලාරම්භයන් පිළිබඳ කතිකාව බෙහෙවින් සක්‍රීයව ගෝලීය මට්ටමින් සිදුවේ. තොරතුරු තාක්ෂණ හා අන්තර්ජාල සන්නිවේදන පහසුකම් හා සමාජ ජාල වෙබ් අඩවි ආදිය නිසා ඒ හා සම්බන්ද වීමට ප්‍රාදේශීය ප්‍රජාවන්ට අවස්ථා විවෘත වී ඇත. එබැවින් ප්‍රාදේශීය ප්‍රජාවන්ට ඔවුන්ගේ ප්‍රාදේශීය ජෛව විවිධත්වයන් අනුප්‍රවාහ ගත කිරීම සඳහා සන්දර්භයක් නිර්මාණය කිරීම ප්‍රමුඛතා කාර්යක් ලෙස සලකා ක්‍රියා කිරීම සුදුසු වේ.
- පහසු කරන පරිසරයක් සුරක්ෂිත කිරීම සඳහා කාර්ය බලකායක් ගොඩ නැගීම, එයට ප්‍රජාවේ සක්‍රිය සහභාගිත්වය ලබාගනිමින් ප්‍රජාවට කාල රාමුවකට අනුගත වූ ඉලක්ක සපුරා ගැනීමට හැකිවන අයුරින් පහසුකම් සැපයීමට සුවිශේෂී කාර්යයක් පැවරිය යුතුය.

දේශගුණ විපර්යාස හා ආපදා තත්වයන් නිසා ඇති වන අභියෝගයන්ට හා නව තත්වයන්ට හොඳින් ඔරොත්තු දීමට හැකිවන සේ පාරම්පරික දැණුම හා තිරසාර ජීවනෝපායන් ජාතික ආර්ථිකයට අනුගත කිරීම නැවත නිර්වචනය කිරීම.

- පාරම්පරික සර්ප විෂ වෛද්‍යවරුන්ට ද ගැලපෙන මට්ටමින් සර්ප විෂ ගල වැනි ජෛව සංස්කෘතික නිෂ්පාදනයන්ගේ ඵලදායීතාවය හා ප්‍රමිතිය නිර්ණය කිරීමට සහතික කරන ක්‍රමවේදයක් නිර්මාණය කිරීම.
- තරුණ පරම්පරාවන් තුල පාරම්පරික ජීවනෝපායන් සඳහා උනන්දුවක් හා ආකර්ෂණයක් ඇති කිරීම සඳහා සමාජ ජාල රසික පිටු, අන්තර්ජාල වෙබ් අඩවි හා බ්ලොග් අඩවි නිර්මාණය ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රාදේශීය හුවමාරු වෙළඳ පද්ධති හඳුන්වා දී අන්‍යෝන්‍ය හුවමාරු ආර්ථිකය ශක්තිමත් කිරීම.
- ග්‍රාමීය ජීවන රටා කෞතුකාගාරය සහ ප්‍රජා මට්ටමේ ජාන බැංකු ඇති කොට ගොවිපල් මට්ටමේ පාරම්පරික කෘෂි ජෛව විවිධත්වය සංරක්ෂණයට හා ජෛව සංස්කෘතික විවිධත්ව සංරක්ෂණයට උනන්දු කිරීම.
- යටත් විජිත පාලකයින් රාජ්‍ය කරන සමයේ ඔවුන්ගේ රටවලට ගෙන යන ලද පාරම්පරික දේශීය දැනුම නැවත ආපසු මෙරටට ගෙන ඒමට කටයුතු සැලසීම. මේ සඳහා එක්සත් ජාතීන්ගේ ජෛව විවිධත්ව සම්මුතිය මඟින්ද ක්‍රමවේද සංවර්ධනය කෙරෙමින් පවතී.

• ප්‍රජාවේ සෞඛ්‍ය සංරක්ෂණ අභිප්‍රායන් සමඟ බාහිර පාර්ශ්ව කරුවන්ගේ සංරක්ෂණ ප්‍රමුඛතාවයන් ගලපාලීම සඳහා වැඩ සටහන් දියත් කිරීම.

• සංස්ථාපිත සමූපකාර අංශය හා පුද්ගලික ව්‍යාපාරික ප්‍රජාව සමඟ සලකන ලද ප්‍රජාවන්ට ජාලගත වී සම්බන්ධ වීමට හැකි වන සේ අවස්ථාවන් විවෘත කිරීම. මෙහිදී නව්‍ය වානිජ මූලාරම්භයන්, සාමූහික සමාජ වගකීම් හා සාමූහික පාරිසරික වගකීම් සම්බන්ධ මූලාරම්භයන් සම්පත් රාශිකරණය සඳහා යෙදවීම සහ ප්‍රජා ජීවනෝපාය කාර්යයන් සඳහා අඩු පොලී ණය ලබාදීම දැක්විය හැකිය.

• ආධාර ලබාදෙන ආයතන සහ ප්‍රජා මූලික හා රාජ්‍ය නොවන සංවිධානයන්ගේ සමාජ ක්‍රියාකාරකම් න්‍යාය පත්‍ර තුලට දරා ගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භයන් ප්‍රමුඛතා මට්ටමින් අනුගත කිරීම. මෙමඟින් පොදු සමාජ හා සංස්කෘතික ක්‍රියාකාරකම්ද ජෛව විවිධත්වයේ චාරිත්‍රාණුගත තිරසාර භාවිතයන්ද එකිනෙක හා සම්බන්ධ කල හැකිය.

**දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂක මූලාරම්භයන් සම්බන්ධ වැඩසටහනේ සොයාගැනීම් ජාතික ප්‍රතිපත්ති රාමුවට හා ක්‍රියාත්මක වැඩසටහන් තුලට අනුගත කිරීම.**

නියඟය, ජල ගැලීම්, නායයෑම්, සුළිසුලං වැනි දේශගුණික විපර්යාස නිසා තීව්‍ර විය හැකි දැනටමත් ජනතාව පෙලන ස්වාභාවික ආපදාවන් හේතුවෙන් ජන ජීවිතය පෙර කිසිදු කලක නොවූ විරූ අයුරින් තර්ජනයට ලක්ව ඇත.

එහිදී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය අත්සන් කරන ලද පාර්ශ්වකාර රජයක් වශයෙන් 2016 වසරේ පැරිස් ගිවිසුමද අත්සන් කරන්නට යෙදුනි.

පැරිස් ගිවිසුමේ සඳහන්ව ඇති දේශගුණ විපර්යාස වැලැක්වීමත් හා ඒවාට අනුගත වීම, අහිමි වීම් හා හානිවීම් ඇගයීම මෙන්ම ක්‍රියාත්මක කිරීමේ ආකාරයන්ට අදාලව ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ලඟා කර ගැනීම සඳහා නීල හරිත ලස්සන ලංකා ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී දේශගුණ විපර්යාසයන්ට අනුහුරු වීම සඳහා ඇති ක්ෂේත්‍රයන් 08 යටතට ජෛව විවිධත්වයද ඇතුලත්ව ඇත. එබැවින් ඒ තුලට ශ්‍රී ලංකාවේ දරාගැනීම් සඳහා වන ප්‍රජා සංරක්ෂණ මූලාරම්භයන්ගේ සොයාගැනීම් අනුකලනය කල හැක.

ඒ අනුව සමස්ත දිවයිනම ආවරණය වන සේ නිර්මාණය කිරීමට සැලසුම් කර ඇති හරිත සුහුරු ගම්මාන (Green-smart villages) 10,000 නිර්මාණය කිරීමේදී පාරම්පරික ප්‍රජාවන්ගේ ජෛව සංස්කෘතික සංරක්ෂණයට අදාල දැණුම් හා අත්දැකීම් අනුකලනය කල හැකිය.

**ස්තුතිය**

ඇගැයීමට සම්බන්ධ වූ ප්‍රජා සාමාජිකයින් සියළු දෙනාටද, ගෝලීය වනාන්තර සංසදයේ ප්‍රධානී සිමෝන් ලිවේරා මහත්මිය, එම සංසදයේ ආසියානු කටයුතු පිළිබඳ සම්බන්ධීකාරක ටීනා රායි මහත්මිය, නිර්මාණී සංවර්ධන පදනමේ ප්‍රධානී නිමල් හේවානිල මහතා, එම පදනමේ මහේෂ් අබේරත්න හා නිශාන්ත යන මහතුන්ට හා ඇගයීමට උපකාර කරන ලද සියළුම දෙනාට අපගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමු!!!

## 5. තොරතුරු සපයා ගැනීමට ඉවහල් වූ ලේඛන


1. http://www.sundaytimes.lk/140202/sunday-times-2/sri-lanka-should-be-called-sinhale-81771.html
2. http://mannaherbaldoctor.blogspot.com/2010/05/deha-dhamma-king-ravanas-divine-body.html

3. https://biodiversityofsrilanka.blogspot.com/2017/04/common-palm-civettoddy-catpalm-cat.html
4. http://www.lankanewspapers.com/news/2006/4/6425.html

5. https://www.facebook.com.Nirmanee Development Foundation › Places › Kegalle

   ,

6. http://lankajalani.org/wp-content/uploads/2015/03/Gender-Issues-in-Agriculture.pdf
7. http://www.npr.org/sections/thesalt/2017/01/26/510610923/sri-lankas-kithul-palm-syrup-an-ancient-sweetener-in-need-of-saving
8. http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=77218
9. http://dl.nsf.ac.lk/bitstream/handle/1/14119/ER-36-(1-2)_48.pdf?sequence=2
10. https://www.doa.gov.lk/rrdi/images/Mydoc/publication1.pdf


### ඇමිණුම

**ජනතා මිතුරු නීති පදනමේ මිහිරි ගුණරත්න මහත්මිය විසින් සිදුකරන ලද පාරම්පරික ජීවනෝපායයන්ට බලපාන නෛතික පදනම පිළිබඳ විශ්ලේෂණය**

ඇගයීමට පාදක කරගත් එක් එක් ප්‍රජාවන්ගේ ජීවනෝපායයන්ට අදාල වන නීති හා අණපනත්

**කිතුල් මැදීම හා පාරම්පරික සර්ප විෂ වෙද මහතුන්ගේ ජීවනෝපායයන්ට අදාලව**

1907 සංශෝධිත අංක 16 දරන වන සංරක්ෂණ ආඥා පනත

1937 සංශෝධිත අංක 02 දරන වන සත්ත්ව හා තුරුලතා සංරක්ෂණ ආඥා පනත

1988 අංක 03 දරන ජාතික උරුම වන භූමි පනත

1990 අංක 12 දරන වයඹ පළාත් පරිසර ප්‍රඥප්තිය

**දේශීය පාරම්පරික වී ගොවිතැනට අදාලව**

1951 සංශෝධිත අංක 25 දරන පාංශු සංරක්ෂණ පනත

1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත

2003 අංක 22 දරන බීජ පනත

**සාකච්ඡාවේදී මතුවූ කරුණු**

පාරම්පරික ජීවනෝපායයන් හා සබැඳි කටයුතු වන සත්ත්ව හා තුරුලතා සංරක්ෂණ පනත වැනි පනත් මඟින් හඳුනා ගෙන ඇත. කෙසේ වෙතත් වන පරිසර පද්ධතීන් තුල පාරම්පරික ජීවනෝපායයන්හි නියැලීමට සිද්ධියෙන් සිද්ධියට සලකා බලා අනුමැතිය ලබා දීම් සිදුවේ. උදාහරණයක් ලෙස වන සංරක්ෂණ ආඥා පනත යටතේ රක්ෂිත කලාප වටා ඇති ස්වාරක්ෂක කලාප තුල ඇති කිතුල් ගස් මැදීම සඳහා අවසර ලබා දීම දැක්විය හැකිය. එවැනි අවස්ථා වලදී වානිජ අරමුණු සඳහා වනජ නිෂ්පාදන ඉවත් නොකිරීමට වග බලා ගත යුතුය.

එමෙන්ම දේශීය වී ගොවිතැනෙහි නියැලෙන විට පාංශු සංරක්ෂණ කටයුතු කිරීම අනිවාර්ය වේ. කෙසේ වෙතත් බීජ පනතේ විධිවිධාන සම්පූර්ණ නොකිරීම හේතුවෙන් දේශීය වී වෙළෙඳපොලේ විකිණීම සඳහා සීමාවන් පැනවූ අවස්ථා ඇත. ඒ හැරුනු විට වී බෝගයට හානි කරන පලිබෝධ හානි ආදිය පාලනය කිරීම ශාක ආරක්ෂණ පනත වැනි නීතිමය මෙවලම් මඟින් සුරක්ෂිත කල හැකිය.